*2017 මාර්තු මස **14**අඟහරුවාදා දින2017மார்ச் மாதம் 14 ஆம் திகதி*

***செவ்வாய்க்கிழமைTuesday 14 th March**2017*

ගරු නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ பிரதித் தவிசாளர் உதயகாந்த குணதிலக அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.mHon.D.ChairmanUdayakanthaGunathilakapreside the Chair

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක**கௌரவ பி.தவிசாளர்*
*உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka*

---------------------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා පළමුව. ගරු අමාත්‍යවරුනි, ගරු මන්ත්‍රීවරුනි, ඒ වගේම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු සංවිධායකවරුනි, 2017 ක් වූ මාර්තු මස 14 වෙනි අද දින සභාව පවත්වාගෙන යාම සඳහා සියළුදෙනාගේම සහය බලාපොරොත්තු වෙනවා. ඒ අනුව පළමුව න්‍යාය පත්‍රානුකූලව තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් : නැත**

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත.**

**ගරු සභාපතිතුමාගේ නිවේදන : නැත**

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳයෝජනා :**

ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා.
ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.
ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.
ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.
ගරු මන්ත්‍රී ආනන්ද මිල්ලන්ගොඩ මැතිතුමා.
ගරු මන්ත්‍රී ඉඳුනිල් ගුණසේන මැතිතුමා.
ගරු මන්ත්‍රී ප්‍රභාත් ද අල්විස් මැතිතුමා.
ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර මැතිතුමා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක**கௌரவ பி.தவிசாளர்*
*உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka*

---------------------------------------------------------------

එතුමන්ලා සඳහා සභාවේ නිවාඩු අනුමත වෙනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :**

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක**கௌரவ பி.தவிசாளர்*
*உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka*

---------------------------------------------------------------

ගරු මන්ත්‍රී ආරියවංශ බාලසූරිය මැතිතුමා විසින් 2017.02.07 සහ 2017.02.28 දිනැති සභාගත කරන ලද ලිපිය සඳහා පිළිතුරු මේ වෙනකොට එවලා තියනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත**

**පෙත්සම් : නැත**

**ප්‍රශ්න :**

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka*
---------------------------------------------------------------

ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා සහ එතුමාගේ ඒ ප්‍රශ්නය සඳහා ප්‍රධාන ඇමතිතුමා අද සභාවේ නොමැති නිසා ඊළඟ සභාවට පිළිතුරු ලබාදීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරනවා. එතුමාගේ දෙවෙනි යෝජනාව සඳහාත් ලබන සභාවට පිළිතුරු ලබාදීමට අවශ්‍ය කටයුතු කරනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ යෝජනාවත් මේ වෙනකොට ලැබිලා නෑ. ලබන සභා වාරයට ඒ පිළිතුරු ලබාදෙන්න කටයුතු කරනවා.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත**

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka*
---------------------------------------------------------------

මේ යටතේ නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*** *கௌரவ நமிந்த அனுரபிரிய*
*Hon.MemberNamindaAnurapriya*-----------
---------------------------------------------

ගරු සභාපතිතුමනි, පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මම අද සභාවට ඉදිරිපත් කර සිටින්නේ ගරු සභාපතිතුමනි, සෑම ප්‍රදේශයකම, මගේ ප්‍රදේශයේ, මගේ ගම, මගේ මහ ගෙදරත් ඇතුළත්ව පහුගිය කාලයේ විශාල වශයෙන් සොර සතුරු උවදුරු ව්‍යාප්ත වෙලා තිබෙනවා. මගේ මෑණියන්ගේ නිවසටත් මේ මෑතක දී මම දැනුවත්ව හොරු ඇවිල්ලා තිබෙනවා. මේක ගරු සභාපතිතුමනි, එක්තරා වාහනයකින් ඇවිල්ලා කණ්ඩායමක් බස්සලා , ඊට පස්සේ ගෙවල් රාශියක් එකපාර මංකොල්ලා කාලා ඊට පස්සේ යන කල්ලියක් මේ රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් නෙමෙයි හැම තැනම ව්‍යාප්ත වෙලා තිබෙනවා. මේක අපේ ගමේ විතරක් නෙමෙයි හැම තැනම තියන කාරණාවක්. ගරු සභාපතිතුමනි, මේකට ප්‍රධානම හේතුව තමයි කුඩු ව්‍යාප්ත වීම. මම හිතන්නේ මෑත කාලයේ වැඩිම ග්‍රාමීය ජනතාව මත්කුඩු වලට ඇබ්බැහිවෙලා තිබෙන වැඩිම කාල පරිච්ඡේදය මේ කාලය බවට මට දැනුවත්ව තොරතුරු ලැබිලා තියනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා එක දවසේ ගෙවල් 20 කට, 25 කට වගේ පණින සොර කල්ලියක් දිස්ත්‍රික්කය පුරා විහිදිලා ඉන්නවා. සෑම ප්‍රදේශයකම ගෙවල්වලට සොරුන් ඇතුළත් වෙලා තියනවා. පොලීසිවලට පැමිණිලි ගිහින් තිබෙනවා. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටින්නේ මේ පිළිබඳව අපේ ගරු ප්‍රධාන ඇමතිතුමාත් හිටියා නම් හොඳයි මේ ගැන කථා කරන්න. විශේෂයෙන්ම පොලිස්පතිතුමාට දන්වා යැවිය යුතුයි. අපේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ මේ වෙන මංකොල්ලා ප්‍රමාණය එන්න එන්න දවසින් දවස වැඩි වෙනවා. ඒ වගේම දූෂණ ක්‍රියාවන් එන්න එන්න වැඩි වෙනවා. ඒ වගේම මත්කුඩු

ජාවාරම එන්න එන්න වැඩි වෙනවා. දැන් ඉන්ටර්නෙට් එක හරහා එහෙම නැත්නම් විද්‍යුත් ජාවාරම හරහා තමයි දැන් කුඩු ජාවාරම පටන් අරගෙන තියෙන්නේ. ඒ වගේම කුඩු විකුණන අය පාර අයිනේ ස්ථානවල දාලා යනවා. ඒ වගේම ඊසි කැෂ් මඟින් සල්ලි ගෙවනවා. ඒ වගේම කුඩා ගම්මානවල හා කඳු ආශ්‍රිතව ඉන්න තරුණ තරුණියෝ ගණනාවක් මේ වෙනකොට මේ මත්කුඩු උවදුර සඳහා ඇබ්බැහි වෙලා තියනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා මේ මත්කුඩු ජාවාරම නැති කරන්නටත්, ඒ වගේම මේ අළුතෙන් ආරම්භ වෙලා තිබෙන මේ සොර කල්ලි පිළිබඳව විශේෂයෙන්ම පොලීසිය මීට වඩා උවමනාවෙන් කටයුතු කළයුතුයි කියන කාරණාවත්, ඒ වගේම හොරුන් නිදහසේ පොලීසිවලින් නිදහස්ව යෑම පිළිබඳවත් යම් යම් ගැටළු තිබෙන බවත් මේ සභාවට ගරු සභාපතිතුමනි, මම මතක් කර සිටිනවා. ස්තුතියි !

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*

*Hon.D.ChairmanUdayakanthaGunathilaka*

---

බොහොම ස්තුතියි ! ගරු මන්ත්‍රීතුමනි. මීළඟට අරුණ නිලන්ත ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව

***ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ*** *கௌரவ நிலந்த ஜயசிங்க*

*Hon Member NilanthaJayasighe* ------------------------

---

ගරු සභාපතිතුමනි, මගේ කාරණාව වෙන්නේ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිතුමා 2017.03.06 වෙනි දින මගේ පුද්ගලික දුරකථනයට ඇමතුමක් දීලා මට තර්ජනයක් කළා. මොකද දැනට ගබ්බෙල, ඇන්දාන මාර්ගයේ ගබ්බෙල ගඟ හරහා පාළමක් ඉදිවෙමින් පවතිනවා. ඉතින් ඒ පාළම ඉදිවෙන කොටසේ බිම් කොටස අයිති වෙන්නේ මටත්, මගේ පියාටත්. මේ අවස්ථාවේ දී මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මේකට මැදිහත් වෙලා මගේ ඉඩමේ තියන පස් ටික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අයිති පස් තොගයක් කියලා මේ පස් ටික අරන් යන්න කටයුතු කළා. ඒ අවස්ථාවේ මම මැණික් හා ස්වර්ණාභාරණ අධිකාරියේ සභාපතිතුමාට මගේ නීතිඥයා ලව්වා මම එන්තරාවාසියක් යැව්වා මේ පිළිබඳව මට අසාධාරණයක් වෙලා තියනවා, මේ පස්වල අයිතිය තියෙන්නේ බිම් අයිතිකරුවන්ට. ඒ අවස්ථාවේ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිතුමා මේ එන්තරාවාසියට කිසිම පිළිතුරක් නොඑවා මගේ දුරකථනයට දුරකථන ඇමතුමක් දීලා මට තර්ජනය කරනවා තමුන්නාන්සේ පිළිබඳව මම දන්නවා. තමුන්නාන්සේ ජනාධිපතිතුමාට වෙඩි තියපු පුද්ගලයෙක් බවත් මම දන්නවා කියලා මට තර්ජනය කරනවා. මම කිව්වා ඒ පිළිබඳව ඔබතුමා දන්නවා නම් අධිකරණයේ නඩුවත් පවතිනවා ඒ සම්බන්ධයෙන්. එහෙම දෙයක් වුනා නම් අධිකරණයට ඇවිල්ලා ඒ පිළිබඳව සාක්ෂි ලබාදෙන්න කියලා. හැබැයි මොහු මට තර්ජය කරනවා මේ කියන ප්‍රදේශයේ මගේ ලඟ තියනවා මේ සියළුම අයිතිවාසිකම් පිළිබඳ ඔප්පු සහ සියල්ල තියනවා. මෙන්න මැණික් සංස්ථාව ගැසට් නිවේදනයකින් නිකුත් කරලා තියනවා මේක මැණික් සංස්ථාව සතු කරගන්න. ඉල්ලම් කියලා පස් ටික මැණික් සංස්ථාව සතු කරගන්න. මම කියන්නේ මේ දේ, මේක වැරදි පූර්වාදර්ශයක්. මොකද මැණික් සංස්ථාවේ සභාපතිවරයා සහ ඒ කාර්යය මණ්ඩලය එකතු වෙලා මහජනතාවගේ දේපළ මංකොල්ලා කනවා නම් මේක වැරදි පූර්වාදර්ශයක්. මේක මන්ත්‍රීවරයෙක් වන මට, මගේ ඉඩමට සිදුවූ නිසා මට මේ ගැන කථා කරන්න පුළුවන්. මොකද එන්තරාවාසියෙන් කියලා තියනවා මේ පාළම ඉදිකිරීම සඳහා මගේ ඉඩමේ බිම් කොටස අවශ්‍ය ආකාරයෙන් ලබාදෙනවා

කියලා. හැබැයි මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අයිති විදිහට අනවශ්‍ය විදිහට මේ පස් ටික ගෙනයාම තහනම්. මේ තියෙන්නේ පාළම ඉදිකිරීම නිසා මගේ ඉඩමට වෙලා තියන හානිය. මෙම මාර්ගයේ පළල බැලුවොත් ප්‍රාදේශීය සභාවේ ගැසට් වෙලා තියනවා 1993.02.18 වෙනි දින ඒ ගැසට් එකේ තියෙන්නේ ගැඩුමවෙල සිට හීන්දෙණිය දක්වා පාර පළල අඩි 08 යි. දගින් මීටර් 1640 යි. ඊට පස්සේ පළාත් සභාවේ ගැසට් වෙලා තියනවා 2006 ගැසට් එකේ මෙන්න තියනවා 2006 අම්බලන්වත්ත, කළල්ඇල්ල, පනාපිටිය, ඇන්දාන මාර්ගය. එතකොට පාරේ දුර තියනවා කිලෝ මීටර් 11.20 ක්. මේකේ පළලක් සඳහන් වෙලා නෑ. මම මේ පිළිබඳව අපේ විධායක ඉංජිනේරුතුමාට ලිඛිතව දැනුම් දීමක් කළා මේ මාර්ගයේ පළල පිළිබඳ දැනුවත් කිරීමක් කළා. හැබැයි ඒ වෙලාවේ එතුමා මට ලිපියකින් දැනුවත් කිරීමක් කරලා තියනවා අම්බලන්වත්ත, කළල්ඇල්ල, පනාපිටිය, ඇන්දාන පාර මාර්ගය සම්බන්ධවයි. උක්ත මාර්ගයේ විස්තර සම්බන්ධයෙන් ඔබ විසින් මා අමතන ලද 2017.03.06 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළාත් සභාවේ ඩී ශ්‍රේණියේ මාර්ගයක් ලෙස උසස් කර ඇත. එසේ වුවද අදාළ මාර්ගය පළාත් සභා මාර්ගයක් ලෙස උසස් කිරීමේ දී එහි දුර ප්‍රමාණය වන කිලෝ මීටර් 1.2 ක දුරක්, මම හිතන්නේ මේකේ වැරදීමක් වෙලා තියනවා කිලෝ මීටර් 12 ක දුරක් ඇතුළත් කර ඇති අතර, එම මාර්ගයේ නිශ්චිත පළලක් ගැසට් පත්‍රයේ සඳහන්ව නැත. සාමාන්‍යයෙන් මෙවැනි පවරා ගත් නිශ්චිත පළලක් සඳහන් කිරීමක් සිදුනොවේ. මෙන්න සාමාන්‍ය නීතිය. මැණික් සංස්ථාවට ගිහිල්ලා මම මේ පිළිබඳව ඇහුවාම පස්සේ මම ඇහුවා ඔබතුමන්ලා ගැසට් පත්‍රයක් බලලා තියනවාද ? මේ පිළිබඳව ඉඩම් හිමියන් දැනුවත් කරලා තියනවාද ? මේක මේ රජයෙන් කරන ව්‍යාපෘතියක්. පාළමක්. අපි ගමේ ජනතාව විදිහට අපි පරිත්‍යාගයක් කරලා තියනවා සාමාන්‍ය ක්‍රමවේදය තමයි රජයට අවශ්‍ය නම්, යම්කිසි බිම් කොටසක් අවශ්‍ය නම් මොකද මම ප්‍රාදේශීය සභාවක හිටපු සභාපතිවරයෙක්. බිම් කොටසක් අවශ්‍ය නම් ඒකේ නීත්‍යානුකූල වැඩ පිළිවෙලක් තියනවා. මේක අත්පත් කරගෙන රජයට අවශ්‍ය ආකාරයට ඉදිකිරීම් කරන්න. නමුත් මේ අත්පත් කර ගැනීමක් කිසිම දෙයක් කරලා නෑ. මේ ඉඩම සම්පූර්ණයෙන්ම කුරහන් සේරු 20 ක් තමයි මේකේ සඳහන් වෙලා තියෙන්නේ. මේ කුරහන් සේරු 20 ක ඉඩම මේ මාර්ගය නිසා තමයි දෙකට බෙදිලා තියෙන්නේ. මේ මාර්ගයේ එදා හිටපු අය, ආදි මේකේ හිමිකරුවන් මේක පරිත්‍යාග කරලා තියනවා මාර්ගයට. හැබැයි මේ මැණික් සංස්ථාව මේ සංවර්ධන කටයුත්ත අද වෙනකොට නවත්වලා තියනවා. මේ හදපු පාළම දැන් අද නැවතිලා. මේකට එකම හේතුව තමයි ඉංජිනේරු කාර්යාලය සහ කොන්ත්‍රාත්කරුවන් කැමතියි මේ සංවර්ධන කටයුත්ත කරගෙන යන්න. අපි බිම් අයිතිකරුවන් විදිහට අපිත් කැමැත්ත පළ කරලා තියනවා ඔවුන්ට මේක කරගෙන යන්න. මැණික් සංස්ථාව මේකට තහනමක් එවලා තියනවා. මම අහන්නේ මැණික් සංස්ථාවට තියන අයිතිය මොකක්ද මේ මහජනතාවගේ, මේක සංවර්ධන වැඩක්. රටේ වෙන සංවර්ධනයක් නවත්වන්න, රජය විසින් කරන සංවර්ධනයක් නවත්වන්න මැණික් සංස්ථාවට තියන අයිතිය මොකක්ද ? මේක විශාල ප්‍රශ්නයක්. මොකද මේක වැරදි පූර්වාදර්ශයක්. මොකද මට මේ තර්ජනය කළා වගේම, මොකද අද වෙනකොට බන්ධනාගාරගත කරලා තියන, බන්ධනාගාරයේ ඉන්න සැකකරුවන්ට මගට ඇවිල්ලා වෙඩි තියන්න පුළුවන් කාලයක්. මේ සභාපතිවරයා කියන්නේ මේ රජයෙන් පත් කරපු සභාපතිවරයෙක්. මහජන නියෝජිතයෙක් වෙන මට කථා කරලා තර්ජනය කරන්න ඔහුට තියන අයිතිය මොකක්ද ? ඔහුට තියන බලය කුමක්ද ? ඒ නිසා මම අද කියන්නේ මට අද වෙන්න පුළුවන්. හෙට ඔබතුමන්ලාට වෙන්න පුළුවන්. මේකට ආණ්ඩු පක්ෂයක්, විපක්ෂයක් අවශ්‍ය නෑ. මන්ත්‍රීවරයෙකුට ආමන්ත්‍රණය කරන්න සභාපතිවරයෙක් විදිහට, එතුමාට ඒක අවශ්‍ය නම් අපට තිබුණා මේක නීත්‍යානුකූල රාමුවකට යන්න ඕන නම් මම කිව්වා ප්‍රාදේශීය ලේකම්වරයාට කථා කරන්න. ප්‍රාදේශීය සභාවේ විශේෂ කොමසාරිස් කෙනෙක් පත්

කරලා තියනවා. එතුමාට කථා කරන්න. ඒ අය කථා කරලා, ලිඛිතව දැනුම් දීමක් කරලා විධායක ඉංජිනේරු කැඳවලා, මෙය අමාත්‍යාංශයක් හරහා කරන වැඩ පිළිවෙලක්. අමාත්‍යාංශයේ ලේකම් කැඳවලා අපට තැනක් කියන්න. අපි බිම් අයිතිකරුවන් විදිහට අපි එතනට ඉදිරිපත් වෙන්නම්. හැබැයි මේ කිසි දෙයක් නීත්‍යානුකූල රාමුවක නැතුව මේ සභාපතිවරයා තමන්ට අවශ්‍ය විදිහට මේ වගේ ගැසට් පත්‍රයක් නිකුත් කරනවා. මේ වගේ ගැසට් පත්‍රයක් නිකුත් කරන්න ඔහුට තියන බලය කුමක්ද කියන එක ප්‍රශ්නයක්. අනුන්ගේ ඉඩම්වලට ගැසට් කරන්න රජයට තියන අයිතිය කුමක්ද ? මේ ඉඩම්වල ඔප්පු කියලා රජයෙන් ඔප්පුවක් හදලා දෙන්න පුළුවන් නම්, මේක මට වුන නිසා මට මේ පළාත් සභාවේ කථා කරන්න පුළුවන්. හැබැයි ගමේ අහිංසක මනුස්සයෙකුට මේක වුනා නම් මම දන්නවා පහුගිය කාලවල්වල, පහුගිය කාල වකවානුවේ සභාපතිවරයා පත් වෙච්ච දවසේ ඉඳලාම මේ වගේ ඉඩම් මංකොල්ලා කෑම් විශාල ප්‍රමාණයක් සිද්ධ වුනා මේ රත්නපුර දිස්ත්‍රික්කයේ. දැන් කියනවා බැකෝ යන්ත්‍ර තහනම්. පරිසරයට හානි වෙනවා. හැබැයි මැණික් සංස්ථාව බැකෝ යන්ත්‍ර යොදවලා පතල් කපනවා. මැණික් සංස්ථාවට තියන අයිතිය මොකක්ද ? සාමාන්‍ය සිවිල් පුරවැසියාට නැති අයිතියක් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය උදුරාගෙන තියනවා. ඒගොල්ලන්ට කොහොමද බැකෝ යන්ත්‍ර දාලා ඉල්ලම් පස් ගොඩදාන්න පුළුවන් ? ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න සබරගමුව පළාත් සභාව විදිහට. මේක මගේ පුද්ගලික ප්‍රශ්නයක් වුනත් පුද්ගලිකව මම අධිකරණයට යන්න වුනත් සූදානම්. මේ වගේ දේවල්, මේ වගේ රජය විසින් මහජනතාව මංකොල්ලා කන වැඩ පිළිවෙලක් කරන මේ ආයතන ප්‍රධානීන්, මේ ආයතන ප්‍රධානියා මට තර්ජනය කරන්නේ, මට මේ තර්ජනය කරලා මොහු මොන වගේ දෙයක් බලාපොරොත්තු වෙනවාද දන්නේ නෑ. මොකද මේ වගේ තර්ජනය කරන්න පුළුවන් සභාපතිවරයෙක්, එතුමා පත් වුනේ මොන විදිහෙන් ද කියලා මම දන්නේ නෑ. මොකද අපි පත්වෙලා තියෙන්නේ මහජන නියෝජිතයෝ විදිහට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරලා, මැතිවරණයට ඉදිරිපත් වෙලා, මහජනතාවගේ ඡන්දයෙන් අපි මෙතෙන්ට ඇවිල්ලා තියෙන්නේ. ඔය සභාපතිවරු එහෙම නෙමෙයි. කාට හරි පන්දමක් අල්ලලා, ඒ පන්දම් මාර්ගයෙන් තනතුරු ගත්තු සභාපතිවරු. මේ තියෙන්නේ මගේ ඉඩම්වලට වෙච්ච හානිය. මගේ විතරක් නෙමෙයි මේක අපේ මුළු ගමටම වෙන හානියක්. දැන් මේ පාළමේ වැඩ නැවතිලා තියන එක මුළු ගමටම වෙන හානියක්. අද ඇන්දාන සිට කළල්ඇල්ල දක්වා යන මාර්ගය, අම්බලන්වත්තට සම්බන්ධ වෙන මාර්ගය පාර කඩලා, පාළම කඩලා නවත්වලා තියනවා. ගඟෙන් එගොඩ වෙන්න විදිහක් නෑ. මේක එදා ඉඳලා තිබුණ පාළමක්. ඉතින් ඒ වගේ පාළමක් කඩලා විනාශ කරන්න, හදන්න හදනකොට ඒක නවත්වන්න මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට තියන අයිතිය මොකක්ද කියන එකයි ප්‍රශ්නය. මම එතුමාගෙන් ඇහුවා එදා, මට දුරකථනයෙන් කථා කරපු වෙලාවේ මම ඇහුමා ඔබතුමා කොහොමද මේකට සම්බන්ධ වෙන්නේ ? ඔබතුමාට තියන අයිතිය මොකක්ද ? ඔබතුමා කොහොමද මේක ඉල්ලම් පස් කියලා තීරණය කරන්නේ ? එතුමාට පුළුවන්ලු. ඒක මම දන්නේ නෑ, මොන ක්‍රමවේදයක්ද කියලා. එතුමාට පුළුවන්ලු ඒක ඉල්ලම් පස් කියලා තීරණය කරන්න. එතුමාගේ ඉංජිනේරුවා යැව්වාලු එතනට. මට පුද්ගලිකව පතල් කපන්න අවශ්‍ය නම් ම ඒකට මැණික් ගැරීමේ බලපත්‍රයක් ගන්න ඕන. මම ඒ ඉඩමට තවම බලපත්‍රයක් ලබාගෙන නෑ. මට බලපත්‍රයක් ගන්න අවශ්‍යතාවයක් නෑ තවම. මොකද මමත් මැණික් කර්මාන්තයේ නියැලෙන පුද්ගලයෙක්. මම හොරෙන් පතල් කපන්න ගිහිල්ලා නෑ. මම ලයිසන්ස් එකක් අරගෙන තමයි පතල් කපනවා නම් කපන්නේ. හැබැයි මේ සභාපතිවරයා, මට මතකයි ඔය වගේම සභාපතිවරයෙක් ඉස්සෙල්ලත් පත් වුනා. අනිල් කොස්වත්ත කියලා. එයත් මේ වගේම වැඩ කළා. දැන් අද මේ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, හෙට දිනයේ දී මම පැමිණිල්ලක් කරලා තියනවා රත්නපුර

පොලීසියේ විවිධ පැමිණිලි අංශයේ. හෙට දිනයේ දී ඒ පැමිණිල්ල විභාග කරනවා කිව්වා. එම්.සී.ආර් 1224/17 කියන පැමිණිල්ල. මේක විභාග කරනවා කිව්වා. මම කිව්වා සභාපතිවරයාට, මේක විභාග කරන්න අවශ්‍යයි. මොකද මගේ ජීවිතයට විශාල තර්ජනයක් තියනවා. දේශපාලන වශයෙන් පහුගිය කාල වකවානුව තුළ මම මාස 13 ක් බන්ධනාගාරගත වෙලා හිටියා. අද මම ඇප පිට ඉන්නේ. මොහු මේ වගේ ක්‍රියාකාරකමක් කරලා, වෙන මොනවා හරි කුමන්ත්‍රණයක් සූදානම් කරනවා ද කියලා මම දන්නේ නෑ. මගේ ජීවිතයට තර්ජනයක් තියනවා. මොකද මට ආරක්ෂාවක් නෑ. මට පොලිස් ආරක්ෂාව ලබාදීලත් නෑ. මම තනියම ගමන් බිමන් යන්නේ. ඒ නිසා මට විශාල තර්ජනයක් තියනවා මේ සභාපතිවරයාගෙන්. මේ සභාපතිවරයා පත් කරන ලද සභාපතිවරයෙක්. මේ රජයෙන් පත් කරන ලද සභාපතිවරයෙක්. ඒ නිසා මේ සභාපතිවරයා මොනවා හරි වැඩ පිළිවෙලක් යොදාගෙන මාව මේ කුමන්ත්‍රණයට හසු කරන්න හදනවා කියලා සැකයක් තියනවා. ඒ නිසා මේ සැකයත් එක්ක මගේ ජීවිතයට විශාල තර්ජනයක් තියනවා. ඒ නිසා මම විශේෂයෙන් මේ පළාත් සභාවේ මට අද මේක වුනා වගේම හෙට විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට වෙන්න පුළුවන්. අපේ ඇමතිවරයෙකුට වෙන්න පුළුවන්. තවත් මන්ත්‍රීවරයෙකුට වෙන්න පුළුවන්. ඒ නිසා මේක සිවිල් පුරවැසියෙකුට වෙන්න පුළුවන්. හැබැයි මේ මැණික් සංස්ථාවට ඕන විදිහට කටයුතු කරන්න ඉඩ ලබාදීම තුළ මම හිතනවා මේ රටේ පරිසරය, ඒ වගේම අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ මැණික් ව්‍යාපාරය අද නැත්තටම නැති වෙලා තියනවා. මේ මැණික් සංස්ථාව කිසිම තැනක මැදිහත් වෙලා නෑ, ඒ මැණික් ව්‍යාපාරය ගොඩනඟන්න. ඉතින් ඒ නිසා මේ වගේ සභාපතිවරු පත් කිරීම තුළ, මේ මැණික් කර්මාන්තය පිළිබඳව අකුරක්වත් නොදන්නා සභාපතිවරු පත් කිරීම පිළිබඳව මගේ කණගාටුව සහ අප්‍රසාදය පළ කරනවා මේ පළාත් සභාවේ. ඒ නිසා විශේෂයෙන් මතක් කරන්න ඕන, මේ වගේ සභාපතිවරු මේ පිළිබඳව නීත්‍යානුකූල රාමුවක් තුළට මේ වැඩ පිළිවෙල අරගෙන යන්න. මේ මාර්ගය, මේ පාළම සෑදිය යුතුයි. මේ පාළමේ යෝජනාවක් මම ලබාදුන්නා පහුගිය රජය කාලයේ දී. බැසිල් රාජපක්ෂ ගරු ඇමතිතුමාට මම ලබාදුන්නා. මේ රජයෙන් තමයි මේක ආරම්භ වුනේ. අර පාළම් දහයේ වැඩ සටහනට. කොයි රජයෙන් ආරම්භ වුනත් මේක කළයුතු දෙයක්. ඒ නිසා තමයි මම මගේ ඉඩම පරිත්‍යාග කරන්නේ අවශ්‍ය බිම් කොටස. ඒ ඉංජිනේරුතුමාට මම කථා කරලා කිව්වා, එතුමා ඇවිල්ලා බැලුවා. පරීක්ෂණයක් කළා. මම කිව්වා ඔබතුමාට අවශ්‍ය ඕනෑ තරම් කොටසක් ගන්න. ඒකේ මගේ කිසිම විරෝධතාවයක් නෑ. හැබැයි ඔබතුමා මෙතන හම්බ වෙන පස් ටික මගේ ඉඩමට දාන්න. මම ඒ හානිය පිළිබඳව වගකීම භාරගන්නවා. ඒ ගැන ගැටළුවක් නෑ. හැබැයි අද වෙනකොට මේ මැණික් සංස්ථාව සම්බන්ධ වීම තුළ මැණික් සංස්ථාව මේ වෙනකොට මේ මාර්ගයේ, මේ පාළමේ වැඩ නවත්වලා තියනවා. මම අහන්නේ අද මාර්ග සංවර්ධන අධිකාරියෙන්, එහෙම නැත්නම් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් මේ කරන වැඩ සම්බන්ධයෙන් ඒ වැඩ සටහනක් නවත්වන්න මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයාට තියන බලතලය මොකක්ද කියලා. හරිම කණගාටුදායක කාරණාවක්. රජයෙන් පත් කරන ලද සභාපතිවරයෙක් රජයෙන් කරන වැඩ පිළිවෙලක් අද නවත්වලා තියනවා. ඒ මාර්ග සංවර්ධනයට අද එතුමා කිසිම ආකාරයක සම්බන්ධතාවයක් නෑ. මේ ගැසට් පත්‍ර අනුව පළාත් සභා මාර්ගයක් වුනාට පස්සේ ඉදිකිරීම් සීමාව තමයි පාර මැද සිට දෙපසට අඩි 25 ක් වෙන්නේ. එතුමාට අවශ්‍ය විදිහට මේවා නවත්වන්න බෑ. අද නැවතිලා තියනවා. ඒ නිසා හැකි ඉක්මණින් මේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට දැනුම් දෙන්න මේ මාර්ගයේ, පාළමේ වැඩ ආරම්භ කරන්න. අපි බිම්කරුවන් විදිහට අපි කිසිම තහනමක් ඒ වෙනුවෙන් ගේන්නේ නෑ. හැබැයි මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට මේ පොළමේ වැලි කැටයක්වත් ඒගොල්ලන්ට අවශ්‍ය විදිහට අරගෙන යන්න අපි ඉඩ තියන්නේ නෑ. ඒකට

අධිකරණයක් තියනවා. අධිකරණයට ගිහිල්ලා හරි මේ පිළිබඳව අපි තීරණයක් ගන්නවා. මොකද ඒක මානව අයිතිවාසිකමක්. මම මානව අයිතිවාසිකම් වෙනුවෙන් ඒ ගැන කථා කරනවා. මොකද මේ පිළිබඳව ඇත්තටම පළාත් සභාව මැදිහත් වෙලා, ඇමතිතුමනි, ඔබතුමාත් මැදිහත් වෙන්න. ඔබතුමාගේ මැදිහත් වීමත් මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. මොකද මේක මානව හිමිකම් උල්ලංඝණය කිරීමක්. මේ ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක්. ජනතාවගේ දේපළ මංකොල්ලා කන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියක් සහ නිළධාරී මණ්ඩලයක් මෙතන ඉන්නේ කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි !

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* *கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல**Hon.Opposition Whip SiripalaKiriella* ---------------------
--------------------------------

ගරු සභාපතිතුමනි, ගරු නිලන්ත මන්ත්‍රීතුමා කියපු ආකාරයට රාජ්‍ය මැණික් සංස්ථාව මේ වෙනකොට බැකෝ පතල් දාලා තිබෙනවා නම්, බැකෝ පතල් ලංකාව පුරාම තහනම් කරලා තියන වෙලාවක මේ ගැන වහාම සොයා බැලිය යුතුයි ගරු සභාපතිතුමනි. අදාළ තැන්වලට දැනුවත් කරලා, අපේ සබරගමුව පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයා දැනුවත් කරලා, රාජ්‍ය මැණික් සංස්ථාවෙන් බැකෝ දාලා පතල් කපනවා නම් ඒ ගැන විශේෂ පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලනවා ගරු සභාපතිතුමනි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක**கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.ChairmanUdayakanthaGunathilaka*
------------------------------------------------------------

ගරු නිලන්ත මන්ත්‍රීතුමාට වෙලා තියන අසාධාරණය සම්බන්ධවත්, ඒ වගේම ඔහුට ඒ තර්ජනය කිරීම් සහ බිය ගැන්වීම් සම්බන්ධවත් වහාම පරීක්ෂණයක් කිරීමට, ඒ වගේම අතිගරු ජනාධිපතිතුමාට, ඒ වගේම අදාළ අමාත්‍යාංශයට, ඒ වගේම පාළම වැඩ නැවැත්වීම සම්බන්ධව ඒ වගේම ජනතාවට ඒ පාළම ඉදිකිරීම ප්‍රමාද වීම නිසා ඒ ජනතාවට වෙන අසාධාරණය සම්බන්ධව පළාත් පාලන අමාත්‍යාංශයෙනුත් වාර්තාවක් ඉල්ලලා ඉදිරියේ දී නැවත අපි කථා කරලා වැඩ පිළවෙලක් ගැනීම සුදුසුයි. ඒ වගේම ඒ මන්ත්‍රීවරයාට ඒ බිය ගැන්වීම ගැන ඒ කරුණ බොහොම කණගාටුවෙන් මේ අවස්ථාවේ හෙළා දකිනවා. ඒ වගේම ඒ සම්බන්ධව විධිමත්ව, කඩිනමින් අවශ්‍ය අපේ සභාව හැටියට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්න, ඒ වගේම ඒ අවශ්‍ය තැන්වලට දැනුම් දෙන්න, ඒ වගේම වාර්තා ලබාගන්න මේ අවස්ථාවේ මම නියෝග කරනවා මූලාසනය හැටියට.

*ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ* *கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த* *Hon. Minister Athula Kumara Rahubadda* ---------
---------------------------------------------

සභාපතිතුමනි, ඔබතුමාගේ ඒ නියෝගය අපි ඉතාම ගෞරවයෙන් පිළිගන්නවා. මහජන නියෝජිතයෙක් විදිහට මේ සභාවේ අපි දැක්කා එවැනි මන්ත්‍රීවරයෙකුට එවැනි අවස්ථාවකට මුහුණ දුන්නාම ගරු ආණ්ඩුකාරතුමා සමඟ අමාත්‍ය මණ්ඩලය සහ විපක්ෂයේ බලධාරීන් එක්ක අදාළ නියෝජිතයා ගෙන්නලා සාකච්ඡාවක් කරනවා. මොකද

මෙතුමන්ලාගේ මුතුන්මිත්තෝ තමයි මේක දීලා තියෙන්නේ. අත්පත් කරගෙන නෑ නීත්‍යානුකූලව. අත්පත් කරගත්තා නම් සභාපතිවරයාට පුළුවන් හිතුමතේට අවශ්‍ය කරණ කාරණාව කරන්න. නමුත් මෙවැනි නීතිවිරෝධී වැඩ එදත් කළා. එදත් අපි ඒකට විරුද්ධ වුනා ආණ්ඩු පක්ෂය විදිහට. අපේ ආණ්ඩුවෙන් පත් කරපු සභාපතිවරුන්ට එදත් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විරුද්ධව කටයුතු කරද්දී මේ තත්ත්වයම උදාකරලා දුන්නා. එදා අපි ආණ්ඩු පක්ෂයේද විපක්ෂයේ ද කියලා බැලුවේ නෑ. කොයි පැත්තේ හිටියත් මේක හිතුමතේ කරන එකට විරුද්ධව, මෙහෙම එතුමන්ලාට කරන්න බෑ. ගැසට් කරන්න, ඒ මාර්ගය එහෙම නම් පළාත් සභා මාර්ගයක්. පාර පළල් කරන්නේ ප්‍රාදේශීය සභාව. ඒ සියල්ල තියනවා. එහෙම හිතුමතේ අත්පත් කරගෙන නම් මුදල් ගෙවලා එතුමාට ඒ තර්කයට යන්න බෑ. එහෙම කරගෙන නෑ. සද්භාවයෙන් දීපු කාරණාවක්. ඒ නිසා ඒක එතුමාට දැන් තියන කාරණාවත් එක්ක විශාල තර්ජනයක් නිසා ඉතාම කඩිනමින් ඔබතුමාගෙන් ඉල්ලනවා ගරු ආණ්ඩුකාරතුමා එක්ක වහාම සාකච්ඡාවක් කරලා මේක නිවැරදි කරන්න.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.ChairmanUdayakanthaGunathilaka*
------------------------------------------------------------

ඒ සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමාත් එක්ක සාකච්ඡාවක් සඳහා කණ්ඩායමක් හැටියට අපි නම් කරලා ඒ සම්බන්ධව කඩිනමින් සාකච්ඡාවක් ඉල්ලලා ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාවක් ඉල්ලන්න කියලත් මේ අවස්ථාවේ යෝජනා කරනවා. බොහොම ස්තූතියි ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම සම්බන්ධව.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර* கௌரவ உறுப்பினர் அஜித் குமார*Hon.MemberAjith Kumara*------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමා මතක් කරපු ආකාරයට ඒ මන්ත්‍රීවරයාට සිදුවෙලා තියන අසාධාරණය හෝ ප්‍රශ්නය පිළිබඳව ඒ පෙර ක්‍රියාත්මක කරපු ආකාරයටම ක්‍රියාත්මක කිරීම සුදුසුයි කියලා අපි මතක් කරනවා. ඒ ගැන හොයලා බලලා ඒ විදිහට ඔබතුමා ඒ ගැන දැනුවත් වීමක් නැත්නම් ඒ ගැන හොයලා බලලා ඒ ආකාරයටම මේ ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කරන්න කියනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.ChairmanUdayakanthaGunathilaka*
------------------------------------------------------------

ඒ අනුව ක්‍රියාත්මක වෙනවා වගේම සභාවෙන් වෙන්න අවශ්‍ය කාරණා ටික ඒ අදාළ දැනුම් දීම් කරලා ඒ අවශ්‍ය වාර්තා කැඳවලා, ඒ අවශ්‍ය තැන්වලට දැනුම් දීම් කරලා ඔහුට අසාධාරණයක් වගේම ඒ වෙලා තියන කාරණා ආපහු නොවෙන විදිහට මේ සභාවෙන් අවශ්‍ය කටයුතු කිරීම තමයි අපි මේ අවස්ථාවේ යෝජනා කරන්නේ.

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත.**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා :**

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.ChairmanUdayakanthaGunathilaka*
------------------------------------------------------------

සමුපකාර රීති මාලාව සම්බන්ධයෙන් අදාළ විෂයය භාර ඇමතිවරයා විදිහට ප්‍රධාන ඇමතිතුමා නොමැති නිසා අද ඉදිරිපත් කරන්නේ නෑ.

**පළාත් සභාවේ පොදු කටයුතු : නැත**

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.ChairmanUdayakanthaGunathilaka*
------------------------------------------------------------

ඒ යටතේ ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාගේ 6/1/2017/4 යටතේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*Hon.Opposition Whip SiripalaKiriella* ----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මගේ යෝජනාව මධ්‍යම රජයට මෙන්ම පළාත් සභාවලට ද තරුණ තරුණියන්ට රැකියා ලබාදීම වර්තමානය වනවිට ප්‍රබල ගැටළුවක්ව පවතී. මෙවන් පසුබිමක සබරගමුව පළාතේ රාජ්‍ය ආයතනවල පවතින ඉහළ ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා විශ්‍රාමික නිළධාරීන් යළි සේවයට කැඳවන බවට දැන ගැනීමට ලැබුණ අතර, ඒ පිළිබඳව සොයා බැලීමේ දී එම තොරතුරු සත්‍යයක් බව ද අනාවරණය විය. අද වනවිට උපාධිධාරීන්, විද්‍යාපීඨ, ඩිප්ලෝමා, සාමාන්‍ය පෙළ, උසස් පෙළ සහ අද ලොව පවතින තාක්ෂණයට ගැලපෙන පරිදි වූ විවිධ ආයතන හා වෘත්තීය තාක්ෂණ පාඨමාලා හදාරණ ලද විශාල තරුණ පිරිසක් රැකියා විරහිතව හිඳී. ගරු සභාපතිතුමනි, එබැවින් විශ්‍රාමික නිළධාරීන්ගේ සේවය දීර්ඝකොට තවදුරටත් සේවයේ තබා ගැනීම නවත්වා ඉහත සඳහන් උගත් තරුණ පිරිසට රැකියා ලබාදීම සඳහා වහාම විධිමත් ක්‍රමවේදයක් සකස් කර අවශ්‍ය පියවර ගතයුතු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මේක දැනට වසර කීපයකට කලිනුත් ආවා. ඒ ආවේ සණස සභාපතිවරයා අවුරුදු 68 ක් වන පුද්ගලයා ඒකේ සභාපති කරවීමයි. ඒ කරුණු මේ සභාවට පැහැදිලි කිරීමේ දී ඒ පුද්ගලයා අයින් කෙරුවා. ඊට පසුව මේ සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ධූරයක් දරපු නිළධාරියෙක් ඉඳලා ඒ නිළධාරියා ගැනත් මේ සභාවේ කථා කෙරුවාට පසුව ඒ තනතුරෙන් අයින් කළා. දැන් ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගත්තාම විශ්‍රාම ගිය අය නැවත සේවයේ පිහිටුවන්නට කොන්ත්‍රාත් පදනම වෙන්න පුළුවන්. මොන ආකාරයෙන් ද අපි දන්නෙ නෑ

කියන්න. කොහොම හරි සේවයේ පිහිටුවන අතර ගරු සභාපතිතුමනි, අද විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් ලක්ෂ ගණන් ඉන්නවා. උපාධිය අරගත්ත අය ඉන්නවා. උසස් පෙළ සමත් වෙච්ච අය ඉන්නවා. සාමාන්‍ය පෙළ සමත් වෙච්ච අය ඉන්නවා. මේ අය ගත්තාම ගරු සභාපතිතුමනි, මේ අය විරැකියාවෙන් පෙළෙන අතර, වසර 60 ක් සේවය කරපු ඒ නිළධාරියා විශ්‍රාම ගිහිල්ලා නැවත කොන්ත්‍රාත් පදනම මත සේවයේ පිහිටුවනවා නම් ඒක අපි දකිනවා තදබල වරදක් විදිහට ගරු සභාපතිතුමනි. එහෙම නම් මේකට වියයුතු වෙන්නේ සුදුසු අය පත්කර ගැනීමයි. ඒ සුදුසු අය ඒ තනතුරුවලට අධ්‍යාපන අධ්‍යක්ෂ වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ලේකම් වෙන්න පුළුවන් ඒ තනතුරුවලට සුදුසු අය පත්කර ගන්නා අතර, පුරප්පාඩුවලට තරුණ තරුණියන්ට අවස්ථාව ලබාදීම කියන යෝජනාව තමයි ගරු සභාපතිතුමනි, මේ සභාවට ගෙනාවේ.

මේ යෝජනාව ඉදිරිපත් කරන අතර, මේ සම්බන්ධව යෝජනා අපි මේ පළාත් සභාවට ඕනෑ තරම් ගෙනල්ලා ඇති. මේ පැත්තෙන් අහලා අනෙක් පැත්තෙන් යෝජනාව එහාට නොදා මේක මම ඉල්ලනවා ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවට යවන්න කියලා මේ අපි ගේන අද යෝජනාව මුදල් අමාත්‍යාංශයට හා පාර්ලිමේන්තුවට මේක මේ පළාත් සභාවේ මේ ආකාරයට කථා කෙරුවා කියලා. බොහොම ස්තූතියි ! ගරු සභාපතිතුමනි, වෙලාව ලබාදීම සම්බන්ධව.

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය* *கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய*
*Hon. Minister BhanuMunipriya*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ.......

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* *கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரியெல்ல**Hon.Opposition Whip SiripalaKiriella* -----------------------------------------------------

සෑම තැනකම විශ්‍රාම ගිය උදවිය නැවත බඳවා ගැනීම. අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙන්න පුළුවන්. වෙනත් එකක් වෙන්න පුළුවන්. හැම දෙයකටම කියන්නේ විශ්‍රාම ගිය අය ගන්නවා වෙනුවට,

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය* *கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய*
*Hon. Minister BhanuMunipriya*
-----------------------------------------------------------

අධ්‍යාපන අමාත්‍යාංශයේ කීප දෙනෙක් අරගෙන තියනවා. ඒ කියන්නේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පළවෙනි ශ්‍රේණියේ අපට ඉන්නේ පරිපාලන නිළධාරීන් තුන්දෙනයි. පුරප්පාඩු 89 යි. මම අධ්‍යාපන අමාත්‍යධූරයේ දිවුරුම් දෙනකොට පුරප්පාඩු සංඛ්‍යාව 78 යි. ඉතින් එම නිසා ඒ ශ්‍රේණිය නැති කිසිකෙනෙක් එම තනතුරේ තබන්න බෑ. දැන් රේඛීය අමාත්‍යාංශය මඟින් තමයි මේ දීපව්‍යාප්ත අධ්‍යාපන පරිපාලන නිළධාරීන් බඳවා ගැනීමේ කටයුත්ත කරන්නේ. එයින් දැන් විභාගය තියලා තියනවා. සම්මුඛ පරීක්ෂණ තිබ්බාම මේ කියන ප්‍රමාණය අළුත් අයගෙන් පිරෙනවා. දැන් ඔබතුමා ඉල්ලා හිටපු අධ්‍යාපන අමාත්‍යාංශයේ පරිපාලන සේවයේ විභාගය තියලා, ප්‍රතිඵල ඇවිල්ලා සමත් වෙච්ච අය ඉන්නවා. ඒ අයගේ සම්මුඛ පරීක්ෂණ තියනවා. ඒ අනුව ඒගොල්ලෝ ඇතුළත් වෙනවා. එතකොට අපි ගත්ත 6 දෙනාට මාස 6 යි ලබාදීලා තියෙන්නේ , ඒ අවස්ථාව ඇතුළත ඇතුළත් වෙනවා අළුත් අය. එතකොට මට මේ ප්‍රශ්නය යොමු කරලා තිබුණා කුමන කාරණාවක් හෝ හේතුවෙන්

ඔබතුමාගේ ප්‍රශ්නයක් හැටියට. ඒකයි මම පිළිතුර ලබාදුන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් පදනම මත ලබාදීලා තියන 6 දෙනා...

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* *கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip SiripalaKiriella* -----------------------------------------------------

ඔබතුමාගෙන් පෞද්ගලිකව ඉල්ලුවා. ඒකට පිළිතුරු නැති නිසා තමයි යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කළේ.

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය* *கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister BhanuMunipriya* -----------------------------------------------------------

ඒ යෝජනාවේ මගේ කාර්යය මම මේ කියන්නේ. හැබැයි ඔබතුමා කියන මේ විශ්‍රාමිකයන් ලබාගෙන රැකියාවල්වලට ලබාදීමෙන් තරුණ අයට අවස්ථාව ලැබෙන්නේ නෑ එහෙම කරන්න එපා කියන යෝජනාව සම්බන්ධයෙන් මම කියන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ 6 දෙනෙක් අරගෙන තියනවා. හැබැයි 89 දෙනෙකුගේ හිඟයක් තියනවා. ඒක දැන් විභාග තියලා තියනවා. ඒ විභාගය අනුව අළුත් අය ඇතුල් වෙනවා. එපමණයි ගරු සභාපතිතුමනි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka* -----------------------------------------------------------

පැහැදිලි කිරීම සම්බන්ධව බොහොම ස්තූතියි ගරු ඇමතිතුමනි. මීළඟට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න* *கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன* *Hon.MemberSalithaKarunaratne* -----------------------------------------------

ගරු සභාපතිතුමනි, මා මිත්‍ර මගේ හිතවතා සිරිපාල කිරිඇල්ල මැතිතුමාගේ යෝජනාව මම සංශෝධනවලට යටත්ව ස්ථිර කරනවා. ඉතා හොඳ කාරණාවක් මෙතුමා මතු කරනවා. අද වනවිට උපාධිධාරීන්, විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන්, අ.පො.ස. උසස් පෙළ, සාමාන්‍ය පෙළ සහ ලොව තාක්ෂණයට ගැලපෙන පරිදි විවිධ අධ්‍යාපන හා වෘත්තීය තාක්ෂණ පාඨමාලා හදාරපු විශාල තරුණ පිරිසක් රැකියා විරහිතව හිදී. මේක බරපතල කාරණාවක්. ඒ නිසා පහුගිය සභා වාරයේ දී අපි විසින් කරපු යෝජනාවත් මේ රටේ රැකියා විරහිතභාවය, තරුණ තරුණියන්ට සහ උගතුන්ට තමයි බරපතල විදිහට බලපාන්නේ කියන කාරණාව. ඒ හින්දා උගතුන්ට සහ තරුණ තරුණියන්ට රැකියා ලබාදීමේ ක්‍රමවේදයක් හැදෙන්න ඕන. ඒ සඳහා මේ තියන රැකියා අවස්ථා පළල් වෙන්න ඕන. විවිධ ව්‍යාපෘති හැදෙන්න ඕන. ඒ හින්දා ඒ කාරණාවට එකඟයි. හැබැයි ගරු සභාපතිතුමනි, මෙතුමා කියන විදිහට රජයේ ආයතනවල ඉහළ ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා මේ තරුණ තරුණියන් බඳවා ගත්ත පළියට ඉහළ ශ්‍රේණිවල තියන්න බෑ.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்லHon.Opposition Whip SiripalaKiriella* -----------------------------------------------------

ඒ නිසා තමයි ඊළඟට ඉන්න ජ්‍යෙෂ්ඨයා එතනට දාන්නේ

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன Hon.MemberSalithaKarunaratne* ---------------------------------------------------

එතකොට ඔබතුමා කියන්නේ අවුරුදු 60 න් පස්සේ විශ්‍රාම ගන්න අය යවන්න ඕන. ඒගොල්ලන්ගේ පරිචයෙන්, දැනුමෙන්, අත්දැකීමෙන්, මහා පළල් බවින් මේ සමාජයට ප්‍රයෝජනයක් ගන්න ඕන නෑ කියලයි. ගරු මන්ත්‍රීතුමාගෙන් මම දැන ගන්න කැමතියි 2017 සැප්තැම්බර් මාසයෙන් පස්සේ ගරු සිරිපාල කිරිඇල්ල මැතිතුමා ඔබතුමා දේශපාලනයෙන් සමුගන්නවාද ? කට උත්තර නෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි, 60 න් පස්සේ ගෙදර යවනවා නම් නිළධාරීන්, දේශපාලඥයින්ටත් ගෙදර යන්න කියලා කියන්න. ඒකට ලෑස්ති නෑ. මේ වැඩ කරන දක්ෂ නිළධාරීන්ටයි ගෙදර යන්න කියලා කියන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙතුමාගේ යෝජනාවේ හොඳ පැත්තක් තියනවා. ඒක අපි අගය කරනවා. හැබැයි එහෙම කියලා ඉවර වෙලා වයස මතම තීරණ අරගෙන සියළුදෙනාම සමුගන්න ගියොත් එහෙම අපේ සමාජය අක්‍රීය වෙයි. ඒ මිනිස්සුන්ගේ මහා දැනුම් සම්භාරය, අත්දැකීම් සම්භාරය මේ සමාජයට අවශ්‍යයි. ඒ හින්දා ගරු සභාපතිතුමනි, මේ යෝජනාවට මම සංශෝධනයක් විදිහට විශ්‍රාම ගන්නා වයස සීමාව වැඩි කරලා වැඩ කරන්න බැරි කාලයේ යැව්වාට කමක් නෑ. එහෙම කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි !

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.ChairmanUdayakanthaGunathilaka* -----------------------------------------------------------------

බොහොම ස්තුතියි ගරු සලිත මන්ත්‍රීතුමනි. මීළඟට ගරු අජිත් කුමාර මැතිතුමා.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර கௌரவ உறுப்பினர் அஜித் குமாரHon.MemberAjith Kumara*---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින්, ඒ වගේම අපේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු සංශෝධනය ගැනත් සඳහන් කරමින් එතුමා කියන විදිහට එහෙම නම් හිටපු ජනාධිපතිතුමාත් මේ වෙනකොට විශ්‍රාම යන්න ඕන. එහෙම අයින් වුනේ නෑ. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් වුනා. දැන් ආයෙත් පුළුවන්ද කියලා බලනවා මේ රටේ නායකත්වයට එන්න. ඉතින් ඒක නිසා මේක දේශපාලනයට සම්බන්ධ කරලා අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාට සම්බන්ධ කරන එක, ඒක නිසා ඒ සංශෝධනය මම හිතන්නේ එකම ගමේ නිසා තරහාට ගෙනාවාද කියලා මම හිතනවා. ගරු සභාපතිතුමනි, මේක දේශපාලනයට සම්බන්ධ කරන්න බෑ. මොකද අපේ රටට විශාල සේවයක් කරපු ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමා ජනාධිපති වුනෙත් අවුරුදු 71 දී. එතුමා හදපු ව්‍යවස්ථාව තවම වෙනස් කරගන්න බැරුව දඟලනවා. ඉතින් ඒක නිසා දේශපාලනයට ඒක සම්බන්ධ කරන්න ගියොත් එහෙම සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාටත් මේ වාරයෙන් පස්සේ විශ්‍රාම ගන්න වෙයි. ඒක නිසා විශේෂයෙන්ම අපේ සිරිපාල කිරිඇල්ල

මන්ත්‍රීතුමා මතක් කළේ, යෝජනා කළේ ජ්‍යෙෂ්ඨ තනතුරුවලට කවුරු හරි පත් කරනකොට විශ්‍රාම පූර්ව ගන්වපු අය ඇතුළත් කරගන්නේ නැතුව සුදුසු විභාග තියලා ඉක්මණින් ඒ ස්ථානවලට සුදුසු අය පත් කරලා, පල්ලෙහා ඇති වෙන තනතුරුවලට මේ රටේ ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබපු අයට අවස්ථාව ලබාදෙන්න කියන එක.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර* *கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.MemberAjith Kumara*-----------------------------------------------------------

ඒ නිසා ඒක පටලව ගන්නේ නැතුව අපේ යෝජනාව ඇත්තටම ඉතාම හොඳ යෝජනාවක්. මොකද අපි ඉල්ලා සිටින්නේ මේක පළාත් සභාවෙන් නෙමෙයි ඇත්තටම. මෙතනින් යෝජනා කරලා අපි මහ ආණ්ඩුවට යෝජනා කරලා යවන්නේ විභාග තියලා ඒ සුදුසුකම් ලබපු අය ඒ තනතුරු වලට පත් කරලා පහල තනතුරු වලට මේ රටේ අධ්‍යාපනය විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබපු අය උසස් පෙළ සමතුන් අය, සාමානය පෙළ සමතුන් අය ඒ නිර්දේශ අනුව ඒ ස්ථාන වලට පත් කරන්න කියන යෝජනාව. ඉතාම අවශ්‍යතාවයක්. අපි දන්නවා අධ්‍යාපන ක්ෂේත්‍ර වුණත් ඉහළ තනතුරු වලට නිළධාරීන් ඉන්නවා. ඒවගේම විදුහල්පතිවරු ගත්තොත් අද අවශ්‍ය ශ්‍රේණි වලට විදුහල්පතිවරු නෑ. ඒවගේම පහුගිය වකවානුවේ අපිට විශාල වශයෙන් ප්‍රශ්න වුණා කාර්මික නිළධාරීන් මහත්තුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නොමැතිව ලොකු ප්‍රශ්නයකට මුහුණ දුන්නා. ඒවගේම ඉංජිනේරු මහත්තුරුන්ගේ අඩුපාඩු. ඒ නිසා ඒ තනතුරු වලට සුදුසු අය ඉක්මනින් පත් කරන්න . ඒ ජ්‍යෙෂ්ඨත්වය අනුව විභාග පාස් කරපු තත්ත්වය අනුව සුදුසුකම්ලාභීන් පුද්ගලයින් පත් කරලා පහල මට්ටමක අය මෙතුමාගේ යෝජනාව අනුව ඒ ඒ විෂයන් වලට සාමාර්ථය ලබපු ඒ විභාග සමතුන් පත් කරන්න කියන යෝජනාව අපි යෝජනාව හැටියට මහ ආණ්ඩුවට යවන්නේ. ඒක ඉතාම වැදගත් යෝජනාවක්. ඒ වැදගත් වෙන්නේ මෙතුමා අපිට මේ මතක් කළා වගේ රැකියා නැතුව රැකියා පෝලිමේ සුදුසුකම් ලබපු අය ඉන්නවා. ඒ අය එක පාරටම අධ්‍යාපන අධ්‍යක්ෂක කරන්න කියන යෝජනාව නෙමෙයි මෙතන ඉදිරිපත් කරන්නේ. එහෙම නැතුව පළවෙනි ශ්‍රේණියේ විදුහල්පතිවරයෙක් කරන්න කියලා නෙමෙයි අපි කියන්නේ. අධ්‍යාපන පරිපාලන ශ්‍රේණියේ තුන නැත්නම් දෙක නැත්නම් එකට පත් කරන්න නෙමෙයි අපි මතක් කරන්නේ. ඒ ස්ථානවල තියෙන පුරප්පාඩු වලට විභාග තියලා ඒ සුදුසුකම්ලාභීන් එතෙන්ට පත් කරලා ඉන් ඇති වෙන පුරප්පාඩු ටික පල්ලෙහා මට්ටමක මේ තියෙන විභාග වලට සාමාන්‍ය පෙළ උසස් පෙළ ,උපාධිධාරීන් අද පෝළිමේ ඉන්නවා. ඒ අයට අවස්ථාවක් ලබලා දෙන්න කියන යෝජනාව තමයි මෙතුමා යෝජනා කරලා තියෙන්නේ. ඒ නිසා අපි ස්ථිර කරමින් එය කාලෝචිතයි වැදගත් ඒවගේම අපි දන්නවා අධ්‍යාපන අමාත්‍යතුමාත් එක්ක කතා කළහම අධ්‍යාපන කාර්යාලයක් සම්බන්ධව ඒ නිළධාරීන් සම්බන්ධව එතුමා කියන්නේ එතුමාගේ ලේකම්තුමා කියන්නේ මේකට අවශ්‍ය සුදුසු නිළධාරී මහත්මයෙක් නෑ. ශ්‍රේණිධාරියෙක් නෑ.විභාග පාස් කරපු නිළධාරියෙක් නෑ. විදුහලකට කතා කළත් එහෙමයි. මං හිතන්නේ අපේ මහා මාර්ග ඇමතිතුමාට විශේෂයෙන් බලපාන එකක් තමයි ටෙක්නිකල් ඕෆිසර්ලා. කාර්මික නිළධාරී මහත්තුරුන්ගේ ඌණතාවය. ඒ නිසා වැඩ ප්‍රමාද වෙයි. ඒ නිසා අපි යෝජනා කරන්නේ මේ අවශ්‍ය කරන සුදුසුකම් සම්පූර්ණ කරන විභාග ඉක්මනින් තියලා ඒ අය පත් කරලා ඒ අයගෙන් ඇති වෙන පුරප්පාඩු සඳහා මේ රැකියා අපේක්ෂිත කණ්ඩායම් සුදුසුකම් අනුව බඳවා ගන්න කියන අවශ්‍ය විධිවිධාන සකස් කරන්න කියන මහා ආණ්ඩුවට යෝජනා කරන ඒ යෝජනාව ස්ථිර කරමින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*Hon.D.ChairmanUdayakanthaGunathilaka*------
--------------------------------------------------------------------------------

බොහොම ස්තූතියි ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමාට. මීළගට ආණ්ඩුව පක්ෂය වෙනුවෙන් මම තමයි හිටියේ. නමුත් මම කතා කරන්න යන්නේ නෑ මූලාසනයේ සිටින නිසා. මීළඟට රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*** கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க *Hon.MemberRamya Kumara Weerasinghe* ------------------------------
--------------------------

ගරු සභාපතිතුමනි ස්තූතිවන්ත වෙනවා ඔබතුමාට. අපිට අපේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මම කතා කරන්නත් නෙමෙයි හිටියේ. නමුත් පස්සේ කතා කරන්න හිතා ගත්තේ ඒකේ තියෙනවා කතා කරන්න ඕනම දේවල් ගොඩක්. එතුමා කියනවා මේ රැකියා ප්‍රශ්නය රටේ ලොකුවට තියෙනවා. මම එදාත් කිව්වා රැකියා ප්‍රශ්නය රටේ ලොකුවට තියෙනවා. මේ රැකියා ප්‍රශ්නය මහින්ද රාජපක්ෂ ආණ්ඩුවද රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවද සිරිමාවෝ බණ්ඩාරනායක චන්ද්‍රිකාගේ ආණ්ඩුවද කියලා ප්‍රශ්නයක් නැතුව මොනම මෛත්‍රීපාල සිරිසේන ආණ්ඩුවක් නෙමෙයි ප්‍රශ්නයක් නැතුව කවුරු ආණ්ඩු කළත් රටේ ඉතිහාසයේ ඉඳන් ඉස්සරහට ආපු බරපතල ප්‍රශ්නයක් තමයි රැකියා ප්‍රශ්නය. මේ රැකියා ප්‍රශ්නය විසදන්න පුළුවන් ජගතෙක් සමතෙක් 100% විසඳන්න පුළුවන් වෙච්චි කෙනෙක් මේ රටේ ඉතිහාසයේ කිසිම දවසක බිහි වෙලා නෑ. බිහි වෙන්නේත් නෑ. අනාගතයේ බිහි වෙයි කියලා අපි විශ්වාස කරන්නේත් නෑ. හැබැයි අපිට තිබුණ බරපතල ජනතාවට ඉතා සංවේදී තරුණ තරුණියන්ට දැඩි ලෙස බලපාන ප්‍රශ්නය දඩමීමා කරගෙන රැකියා දස ලක්ෂයක් මේ රටේ තරුණයින්ට දෙනවා කියලා ඒ තරුණයන් රවට්ටලා ඒ තරුණයින් තුළින් රවට්ටලා ආණ්ඩුව අරගෙන දැන් දස ලක්ෂයක් කියලා එකක්වත් දෙන්නේ නැතුව දැන් අපි යෝජනා ගෙනාපුවහම සාධාරණද රටේ මෙච්චර රැකියා ප්‍රශ්නය තියෙනවා මෙච්චර විශ්‍රාම ගිය අයට නැවත සේවයට ගන්න එක නවතත්තන්න කියලා. ඇයි අපි විශ්‍රාම ගිය අය නැවත සේවයට ගන්නේ. විශ්‍රාම ගිය අය නැවත සේවයට ගන්නේ විශ්‍රාම ගිය නිළධාරියා කියලා කියන්නේ විශේෂ හැකියාවන් සහිත සුවිශේෂී ගණයේ දක්ෂතා තියෙන අය. තමයි අපි ගන්නේ. මොකද අපි දන්නවා පොඩ්ඩක් ගරු මන්ත්‍රීතුමා ඉන්නකෝ. ඒ විශේෂයෙන් ඔහුට හෝ ඇයට අදාල විෂය සම්බන්ධයෙන් ඉතාම ප්‍රබල ලෙස ක්‍රියා කල හැකි අත්දැකීම් සහිත ඒ සඳහා විශාල දැනුම් සම්භාරයක් සහිත අයට ඔවුන් විශ්‍රාම ගියාට පස්සේ හොඳට වැඩ කරන්න පුළුවන් කාලයක් තියෙනවා. අන්න ඒ කාලයේදී ඔවුන් අරගෙන ඔවුන්ගේ සේවය රටට ජාතියට අවශ්‍ය කරන සේවය ඔහුගේ සුවිශේෂී හැකියාවන් නැවත ලබා ගැනීමට තමයි අපි විශ්‍රාම ගිය අය ගන්නේ. දැන් අපේ අජිත් කුමාර මැද්දෙගම ගරු මන්ත්‍රීතුමා කියනවා ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමා ජනාධිපති වුණේ 1977 , 64 එහෙම කියමුකෝ. දැන් සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ දේශපාලනය ඇවිල්ලා ප්‍රාදේශීය සභාව ගිහිල්ලා,පළාත් සභාවට ඇවිල්ලා, පාර්ලිමේන්තු ගිහිල්ලා එහෙම උඩට එන කොට දැනුම දක්ෂතා හින්දා ඔහු ඉන්න ඕනෙලු. ඉතිං ඒකම තමයි රජයේ නිළධාරියාටත් අපි කියන්නේ. සමහරවිට ක්ලාක් කෙනෙක් හැටියට ගිහිල්ලා ,සමහර වෙලාවට පියන් කෙනෙක් හැටියට ගිහිල්ලා ඊට පස්සේ සහකාර අධ්‍යක්ෂක වෙලා, අධ්‍යක්ෂක වෙලා ,ලේකම් කෙනෙක් වෙලා ඔවුන් යම්කිසි ඒ විෂය සම්බන්ධයෙන් විශේෂඥයෙක් බවට පත් වෙනවා. අන්න ඒ සේවය නැති කර ගන්නවාට වඩා ඒ සේවය නැවත අවුරුදු පහකින් හරි දීර්ඝ කර ගන්න

ඕනේ. තව අවුරුද්දකින් දීර්ඝ කර ගන්නට ඕනේ. අපිට හොඳයි. අපිට විශේෂ හැකියාවන් නැති වෙන කොට දේශපාලඥයාට හොඳයි. රජයේ නිළධාරියාට හොඳ නෑ, මොන තරම් ආත්මාර්ථකාමීද බලන්න. අපි කියන්නේ අපි ගැන නෙමෙයිලු. දේශපාලඥයාට මෙහෙම ඇවිල්ලා ටික ටික උඩට ඇවිල්ලා ඉතිං ඒගොල්ලන්ට ඇවිල්ලා ඇයි රජයේ නිළධාරියන්ට මොකද වෙලා තියෙන්නේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියම ඕකයි. අනුන්ට හොද නෑ අපිට හොඳයි. දැන් කියන කොට කිව්වා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අච්චර හොරකම් කළා හොරකම් කරපු මඟුලක්වත් අන්තිමට අහු වුනේ නෑ. රත්තරං බිත්තර රත්තරං බිත්තර හොයන්න ගියා. වැලි ගොඩවල් ගොඩ දැම්මත් හොරකම් කරපු දෙයක් හම්බ වුනේ නෑ. හොරකම හොද නෑ කියලා කියපු අය ආපු ගමන්ම පටන් ගත්තේ හොරකම. හොරකමින්මයි පටන් ගන්නේ. මහා භාණ්ඩාගර හොරකම බැඳුම්කර හොරකම පටන් අරගෙන දිගට හරහට දැන් හොරකම් කරගෙන යනවා. අනුන්ට හොරකම හොඳ නෑ. නොකරන එකාටත් හොඳ නෑ කියන ගමන් තමන්ට හොරකම හොඳයි. ඒ තමයි තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය. දූෂණය, භීෂණය,මර්දනය හොඳ නෑ කියනවා. දැන් තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ. දූෂණය හොඳ නෑ කිව්වා. භීෂණය හොද නෑ කිව්වා. ඡන්ද තියන්න ඕනේ කිව්වා. මර්දනය හොඳ නෑ කිව්වා. දැන් මොකක්ද වෙන්නේ. දැන් මේ වෙන කොට රටේ මැතිවරණයක් තියන්නේ නැතුව ප්‍රාදේශීය සභාව තියන්නේ නැතුව, පළාත් සභා මැතිවරණය කල් දාන්නේ නැතුව දැඩි ලෙස මර්දනයක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ප්‍රජාතන්ත්‍රවාදය නැහැ කිව්වා. ප්‍රජාතන්ත්‍රවාදය අකුලමින් ඉන්නවා. ඊට පස්සේ මැරකම හොඳ නෑ කිව්වා. අද පාතාලයෙන් අරගෙන ඇවිල්ලා දිගට හරයට මිනී මරන්න පටන් අරන් තියෙනවා. එතකොට අනිත් අයට හොඳ නෑ, අපිට හොඳයි. ඒක තමයි තමුන්නාන්සේලාගේ සම්ප්‍රදාය. බදු ගහනවා. අපි චූටි බද්දක් ගහපුවහම වැට් එක 12% අපි ගහලා ඒවා ඉතාම සුබෝපභෝගී භාණ්ඩ වලට බදු ගැහුවහම ඒවා හොඳ නෑ. හාල් කිලෝ එකටයි, සීනි කිලෝ එකටයි, පරිප්පු කිලෝ එකටයි අහිංසක මිනිහා කන බොන එකට අහිංසක මිනිහාගේ සේවාවට නින්දිත විදිහට කැත විදිහට බදු ගහලා ඒගොල්ලන්ට හොදයි. මම කියන්නේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ඇත්ත කතා කරන කොට රිදෙනවා. මේ මාතෘකාවට අදාලව කතා කරන්නේ. මේ අහ ඉන්නකෝ. මම කියන්නේ ඔබතුමාගේ මාතෘකාවේ තියෙන අපිට හොඳයි අනිත් අයට හොද නෑ කියන ඳක. මම මේ එක කියන්නේ. එතුමාගේ උපන් ගෙයි ඉඳලා කියන සම්ප්‍රදාය තමයි අපිට හොඳයි. අනිත් අයට හොද නෑ. දේශපාලඥයාට අවුරුදු සීයට හරි කමක් නෑ දේශපාලනය කරන්න පාර්ලිමේන්තුව ඉල්ලන්න හොදයි. හැබැයි අපිට එහෙම හොඳ වුණාට රජයේ නිළධාරීන්ට හොඳ නෑ. අන්න ඒකට උදාහරණයක් තමයි මම මේ පෙන්නුවේ. මෙගොල්ලන්ගේ තියෙන සම්ප්‍රදායේ උදාහරණයක් මේ පෙන්නුවේ. මේගොල්ලන්ගේ සම්ප්‍රදායේ තියෙන උදාහරණයක් මම පෙන්නුවේ. ඇයි වැරදිද උදාහරණය. වැරදි නම් තර්ක කරන්නකෝ මාත් එක්ක. හරියට හරි උදාහරණය මම මේ පෙන්වන්නේ. පැටලලා නෙමෙයි තමුනාන්සේලා හැම එකක්ම පටලවා ගන්න හදනවානේ. හැබැයි පටලවාගෙන මතක තියා ගන්න සැප්තැම්බර් වෙන කොට පැටලිලා වැටෙනවා කියන එක අමතක කරන්න එපා කියලා අපි තමුන්නාන්සේලාට මේ වෙලාවේ මතක් කර සිටිනවා. දැන් බලන්නකෝ ගිය පළාත් සභා වාරයට අපි අරගෙන ආවා සලිත මන්ත්‍රීතුමා මොකක්ද වෘත්තීය තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබපු විශාල පිරිසක්. එළියේ ඉන්නවා කියලා සිරිපාල මන්ත්‍රීතුමා මේ යෝජනාවේ කියනවා. ඇත්ත විශාල පිරිසක් එළියේ ඉන්නවා. හැබැයි ගිය සභා වාරයට සලිත මන්ත්‍රීතුමා ගෙනාපුවහම යෝජනාවක් එළියේ මේ වගේ පිරිසක් ඉන්න හේතුවක් තියෙනවා. ඒ නිසා මේ අයට වුවමනාවක් තියෙනවා රටට ගැලපෙන විදිහට

මේ පුහුණුවීම් අපි වෙනස් කළ යුතුයි කියලා ගෙනාපුවහම ඒකට විරුද්ධව මහා ලොකුවට කෑගහනවා. හැබැයි එතුමා ගෙනාපු ඒ යෝජනාවේ තිබුණ කාරණාව තමයි ඔබතුමාගේ යෝජනාවේ වෙනත් විදිහට ගම්‍ය වෙන්නේ. ඒකට ගහන්න ආවා. එදා යෝජනාවේ ඔය විවිධ ජාතීන් බිච්චට පස්සේ කාලය පොඩ්ඩක් වෙනස් වෙලා වෙන්නේ. නැත්නම් අපි ගිය සභා වාරයේ කතා කරපු දේ . මාස තුනකට ඉස්සෙල්ලා ගේන්න ඇති. කතා කරපු වෙලාව මම කියන්නේ. දැන් එතකොට අපි වෘත්තීය පුහුණුව දෙන කොට රටේ සේවා අවශ්‍යතාවයට ගැලපෙන පුහුණුවක් බවට ඒ වෘත්තීය පුහුණුව කළ යුතුයි කියන යෝජනාව තමයි එදා සලිත මන්ත්‍රීතුමා ගෙනාවේ. ඒක තමයි මේකට විසඳුම. නැතුව මේ විශ්‍රාම යන්න ඉන්න විශ්‍රාම ගිය කට්ටිය අයින් කලා කියලා එතෙන්ට දාන්න පුළුවන්ද අලුත් කෙල්ලෙක් කොල්ලෙක්. අරහෙම දාන්න බැනේ. ඉතාම සීමිත සංඛ්‍යාවෙන් නිසි ප්‍රයෝජන ගැනීම සඳහා තියෙන ඉඩ අහුරන ඉතාම ආත්මාර්ථකාමී ඉතාම ද්වේශසහගත ඉතාම පටුවට හිතපු එක්සත් ජාතික පක්ෂයේ තියෙන මට හොඳයි උඹට හොද නෑ කියන සංකල්පයේ මත සම්ප්‍රදාය මත ඉදගෙන ලියපු ඉතාම පහත් යෝජනාවක් ලෙස මේක හෙලා දකිමින් ඒ අයට නැවත මේක ලබා දිය යුතුයි කියන යෝජනාව කරමින් ගරු සභාපතිතුමනි මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*Hon.D.ChairmanUdayakanthaGunathilaka------
-------------------------------------------------------------------------------

බොහොම ස්තූතියි රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමාට. මීළඟට විපක්ෂය වෙනුවෙන් යෙහෙයියා එම්.ඉෆ්ලාර් මැතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** *கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*Hon.MemberM.Y.M.Iflar
-----------------------------------------

ගරු සභාපතිතුමනි ඉතාමත්ම කාලීනව කල්පනා කරමින් ඒවගේම දැනට රැකියා සම්බන්ධයෙන් රට තුළ පවතින තත්ත්වය පිළිබඳ අවබෝධයක් ඇතුව මෙම යෝජනාව ගෙන ඒමත් ඒවගේම මේ යෝජනාව සාකච්ඡා කරන මොහොතේ විශේෂයෙන් මේ යෝජනාව ස්ථිර කරමින් මධ්‍යම රජයට මෙන්ම පළාත් සභාවට රැකියා යෝජනාවත් සමගම අද මේ මොහොතේ ගරු සභාපතිතුමනි මම ඔබතුමාගෙන් අවස්ථාවක් ඉල්ලා සිටිනවා මධ්‍යම පළාතේ අපේ විපක්ෂනායකතුමිය වශයෙන් කටයුතු කරපු රේණුකා හේරත් මැතිණිය අභාවප්‍රාප්ත වී සිටිනවා. එතුමියට අපි නිවන් සුවය ප්‍රාර්ථනා කරනවා මොකද අපි වගේ මේ පළාත් සභාවේ විපක්ෂයේ කණ්ඩායම විපක්ෂනායකවරියා වශයෙන් කටයුතු කරපු එතුමියට. ඒවගේම ගරු සභාපතිතුමනි මේ සමගම මේ පළාත් සභාවේ අපේ ප්‍රධාන සංවිධායකවරයා වන අපේ විපක්ෂයේ සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ විශ්‍රාම නිළධාරීන්ගේ සේවය දීර්ඝ කොට තවදුරටත් සේවයේ තබා ගැනීම නවත්තා උගත් තරුණ පිරිසට රැකියා ලබා ගැනීම සඳහා වහාම විධිමත් ක්‍රමවේදයක් සකස් කර අවශ්‍ය පියවර ගත යුතු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි අපේ සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා අදහස් කරන්නේ අපේ රට තුළ එදා තිබුණේ අවුරුදු 55 න් විශ්‍රාම යාමේ ක්‍රමවේදයක්. ඉන් අනතුරුව තමයි මේ වනවිට වසර 60 දක්වා විශ්‍රාම යාමේ කාලය දීර්ඝ කර තිබුණත් මේ වනවිට වැඩිහිටියන්ගේ සංඛ්‍යාව දිනෙන් දින වැඩිවෙන මොහොතක අනිත් පැත්තෙන්

අපි අවුරුදු 60 පැන්නාට පස්සේ නැවතත් රාජ්‍ය සේවයට මෙවැනි අය බඳවා ගැනීම තුළින් අපි එක පැත්තකින් කල්පනා කරන්න පුළුවන් ප්‍රවීනයින් හැකියාවන් තියෙන ඒවගේම ඒ සඳහා සුදුසු අය සිටිනවා කියලා හිතන්න පුළුවන්. අනිත් පැත්තෙන් අපිට මේ වෘත්තියට නැවත බඳවා ගැනීම් සහ විවිධ අවස්ථාවලදී විවිධ සමත් වෙච්චි හැකියාවන් තියෙන ඒවගේම එවැනි සුදුසුකම් ලැබිය හැකි අයට අවස්ථාවක් නොමැති අවස්ථාවක් අපි දකිනවා ගරු සභාපතිතුමනි. එතුමාගේ මේ යෝජනාවේ පැති දෙකක් තිබෙනවා. අපේ අධ්‍යාපන ඇමතිතුමා මීට ඉස්සෙල්ලා කතා කරන වෙලාවේ එතුමා කිව්වා මගේ පුරප්පාඩු සංඛ්‍යාව 80 ගාණක් තියෙනවා. මම හය දෙනෙක් මාස හයකට බඳවා ගෙන තියෙනවා. නමුත් මේ නැවත විභාගය සමත් වෙච්චි ප්‍රමාණය ගත්තහම හය මාසයෙන් හය මාසයට දික් කරපු අයට යම් සහනයක් සැලසෙයි කියලා විශ්වාසයක්. අපි හැමෝම බලාපොරොත්තු වෙනවා. පැහැදිලිවම ගත්තහම යම් යම් ප්‍රවීනයින් නැති වෙන වෙලාවක අපි ගත්තත් සමහර අය පුරුදු වෙලා ඉන්නවා මෙවැනි අය කලින් කලට දීර්ඝ ලෙස සේවය ලබා ගැනීම. ඒ තුළින් වෙන්නේත් පහළ ඉන්න නිළධාරීන්ට ඔවුන්ගේ සුදුසුකම් තිබුණත්, හැකියාව තිබුණත්, දක්ෂකම් තිබුණත් ඒවගේම විභාග වලින් සමත් වෙලා තිබුණත් ඔවුන්ට අවස්ථාවල් නොලැබෙන අවස්ථාවල් තිබෙනවා. විශ්‍රාම යනකන්ම ඔහුට සුදුසුකම් තිබුණත් ඔහුට හැකියාව තිබුණත් එවැනි අවස්ථාවල් ඇහිරෙන අවස්ථා අපි දැකලා තියෙනවා. ඒ නිසා එතුමාගේ යෝජනාව වැදගත්. ඒ විතරක් නෙමෙයි ගරු සභාපතිතුමනි මේ යෝජනාව සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාට, අගමැතිතුමාට, ස්වදේශ කටයුතු ගරු අමාත්‍යතුමාට, රාජ්‍ය පරිපාලන ගරු ඇමතිතුමාට සහ ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම විශේෂිත ඉතාම වැදගත් වෙනවා. මම එහෙම කියන්න හේතුව තමයි එක පැත්තකින් ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කරනවා අපි එක් අවස්ථාවක දැකලා තියෙනවා. ඒවගේම රජයේ ප්‍රතිපත්තියක් වශයෙන් විවිධ අවස්ථාවක එවැනි දේවල් සිදු වෙනවා අපි දැකලා තියෙනවා.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*** *கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.MemberK.L.Ratnayake*

------------------------------------------------

මේ සභාවේ සංණපූර්ණය නෑ.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka*------ ---------------------------------------------------------------------------------

මේ අවස්ථාවේ බෙල් එක නාද කරන්න නියෝග කරනවා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** *கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.MemberM.Y.M.Iflar*

----------------------------------------

ගරු සභාපතිතුමනි මෙවැනි දේවල් අපි ඉතා උනන්දුවෙන් ,වුවමනාවෙන් අවශ්‍යතාවය මත කාලීන අවශ්‍යතාවය මත සිදු විය යුතු දෙයක්. එතුමාගේ කතාවේදී පැහැදිලි කළා ඒවගේම උපාධිධාරීන් අද උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් බෝඩ් අල්ලගෙන ඉන්නවා. ඇයි ඒ. අපි වැරදි අනුගමනය කිරීම සහ ඒවගේම නිවැරදි ප්‍රතිපත්තියක් අනුව ඒවගේම අධ්‍යාපන ක්‍රමවේදය නිවැරදි විදිහට පරිපාලනය හරියාකාරව නොකිරීම නිසා තමයි මෙවැනි දේවල් සිදු වෙන්නේ. නමුත් හරි ප්‍රතිපත්තියක් අනුව හරියාකාරව කටයුතු කළොත් මං හිතන්නේ කර ගන්න පුළුවන්.

එතුමා ඒක තමයි දැක්කේ. එතුමා දෛනිකව එතුමා කරා පැමිණෙන රැකියා ඉල්ලගෙන

එන ඒවගේම උපාධිධාරීන් මේ සඳහා අසාධාරණයට ලක් වෙලා පැමිණිලා සිටින අයගේ අනුව තමයි එතුමා දකින්නේ. ඒක අපිත් දකිනවා. ඒක අපි අනුමත කරනවා. එවැනි ක්‍රියා වලදී ඔවුන්ට සාධාරණය කිරීම අපි හැමෝගේම යුතුකමක් වගකීමක් වෙනවා. එවැනි අවස්ථාවක තමයි එතුමා මේ යෝජනාව ගෙනාවේ. ඒවගේම එතුමාගේ යෝජනාව ස්ථිර කරමින් නැවත වතාවක් මේක අපි දැනුවත් කරමින් රට තුළ මේ සම්බන්ධයෙන් අපේ තරුණ තරුණියන්ට සහ නවකයින්ට සහ ප්‍රවීනයින්ට තමන්ගේ වයස් සීමාවක් නැති පහළ ඉන්න ප්‍රවීනයින්ට මේ අවස්ථාව සලසා දෙන්නට හැකි වේවා යැයි ප්‍රාර්ථනය කරමින් මේ සම්බන්ධයෙන් මම මුලින් දැනුවත් කලා වගේම මා නැවතත් කියනවා අතිගරු ජනාධිපතිතුමාට ,අගමැතිතුමාට, ස්වදේශ කටයුතු අමාත්‍යතුමාට සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමාටත් ,ඒවගේම රජයටත් ඒවගේම ගරු ආණ්ඩුකාරතුමාටත් දැනුවත් කිරීමට ඔබතුමා උපයෝගී කර ගන්නා මෙන් ඉල්ලමින් මේ අවස්ථාව සලසාදීම පිළිබඳව ඔබතුමාට මගේ ස්තූතිය පුද කරමින් මෙය ක්‍රියාත්මක කරමින් අපේ අවශ්‍යතාවය අපේ අනාගත පරම්පරාවට දායාදයක් යැයි ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*------**
-----------------------------------------------------------------------------

බොහොම ස්තූතියි ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමාට. මීළඟට විපක්ෂයේ වෙනුවෙන් සිරිල් පල්ලේපොල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල* கௌரவ சிறில் பல்லேபொலHon.Member Cyril Pallepola**
---------------------------------------------

ගරු සභාපතිතුමනි මගේ හිත මිත්‍ර පළාත් සභා මන්ත්‍රී සිරිපාල කිරිඇල්ල මැතිතුමාගේ යෝජනාව පිළිබඳව කතා කිරීමේදී මට මතක් වුනේ එතුමා කීවේ මේ තනතුරුවල ප්‍රශ්නය කතා කරන කොට විශ්‍රාම අයට තනතුරු දුන්නහම මම දකින්නේ ගරු සභාපතිතුමනි විශ්‍රාම ගිය අයට වැටුපක් හා දීමනාවක් තිබෙනවා. ඒ අතර නැවත මේ තනතුරු දීපුවහම මේ අයට තවත් තනතුරකට දීමනාවක් ලැබෙනවා. ඒ වෙනුවෙන් තමයි එතුමා මේ පැහැදිලි කිරීමක් කලේ. ගරු සභාපතිතුමනි ඔබතුමාත් දන්නවා මමත් මතක් කරන්නට ඕනේ විශ්‍රාමික අපේ ආර්.අබේසිංහ මැතිතුමා මම ඉගෙන ගත්ත පාසැල එදා කිවුල්දෙනිය විද්‍යාලයේ එක වසර ආරම්භ කරන කොට මම අ යන්න කියපු පාසැලේ උත්සවයක් සංවිධායන කලා. මෙතුමා තමයි මේ උත්සවය සංවිධානය කලේ. හැබැයි කරන අවස්ථාවේ ප්‍රධාන අමාත්‍යතුමා නම නාම පුවරුවේ සඳහන් කරලා තිබුණා. උදයකාන්ත ගුණතිලක අපේ උපසභාපතිතුමාගේ නම සඳහන් කරලා තිබුණා. නමුත් මම ඉපදුන ගම අධ්‍යාපනය හදාරපු පාසැල. ඒ ප්‍රදේශයේ ජීවත් වෙන මහජන නියෝජිතවරු හැටියට එදා ඒ උත්සවයේ ඵලකයේ මගේ නම තිබුණේ නෑ. මම එදත් මතක් කළා. මම හිතන්නේ විශ්‍රාම යන්න යන්න පරිණත වෙනවා කියලා කිව්වා. හැබැයි එහෙම එකක් එතන වෙලා නෑ. අත්දැකීම් සම්භාරයක් තියෙන නිළධාරීන් නම් සංවිධානය කරන කොට ඒ ඵලක නිර්මාණය කරන කොට අවශ්‍ය දේවල් කරලා තිබුණේ නෑ. ඒක තමයි එතුමා කීවේ. මොකද හැට පැන්නහම හොට බිම ඇනෙනවා කිව්වා වාගේ අර ,, මට මහළු වයසේ බැරිය වෙන ගායනා පෙර සේ,, අන්න ඒවගේ අමතක වෙනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි මතක් කරන්නට ඕනේ අධ්‍යාපන ඇමතිතුමාට මට මතකයි ගලපිටමඩ මහා විද්‍යාලයේ මේ පසුගිය දවසේ එක වසර පටන් ගත්තා. එක වසර ආරම්භ කරන කොට ප්‍රධාන ඇමතිතුමා අහනවා අධ්‍යාපන ඇමතිතුමා අහනවා. ප්‍රදේශයේ දේශපාලන නායකයෝ යනවා. ගිහිල්ලා ඒ එක වසර පටන් ගන්නවා. මේ නිළධාරියාම කියනවා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමියට මේ උත්සව පටන් ගන්නට එපා. දේශපාලඥයෝ ගෙන්වන්නට එපා. කිසිම සංවිධානයක් නැතුව ගලපිටමඩ මහා විද්‍යාලයේ එක වසර ආරම්භ කිරීම පිළිබඳව මගේ බලවත් කණගාටුව මම ප්‍රකාශ කරනවා ගරු සභාපතිතුමනි. මම එදා අ යන්න කියපු කිවුල්දෙනිය පාසැලේ උස්ස අධ්‍යාපනය හදාරපු ඒ පාසැලේ උත්සවයට යන්නට මට අවස්ථාව ලබලා දුන්නේ නෑ. මම කණගාටු වෙන්නේ ගරු සභාපතිතුමනි ඒ පාසැලේ ඉගෙන ගෙන ඒ ප්‍රදේශයේ ඉන්න ඒ පාසැලෙන් පළාත් සභාවට එකම බිහි වුණු පළාත් සභා මන්ත්‍රී විදිහට මම කණගාටු වෙනවා. ඒ ගැන මම මතක් කරන්නට ඕනේ. ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ රුවන්වැල්ල ආසනයේ සංවිධායකවරයා විදිහට අතාවුද පරාක්‍රමපළාත් සභා මන්ත්‍රීතුමාත් දන්නවා ,නිහාල් ෆාරුක් සහෝදර මන්ත්‍රීතුමාත් දන්නවා ඔබතුමාලාගේ ආසනයේ මේ වුනේ. අපි කණගාටු වෙනවා මහජන නියෝජිතවරු හැටියට ඒක තමයි කිව්වේ වයස අයට මේ තනතුරු දෙන්නට එපා කියලා. තරුණ අයට දුන්නා නම් තරුණ අදහස් අනුව අලුත් වැඩ පිළිවෙලකට යන්නට තිබුණා. ඒක තමයි සිරිපාල කිරිඇල්ල මැතිතුමා කිව්වේ. පරාක්‍රම අතාවුද මැතිතුමා ඒ ආසනයේ. ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා සංවිධායකවරයා, නිහාල් ෆාරුක් මැතිතුමා ඒ ආසනයේ පළාත් සභා මන්ත්‍රීවරයා. මම ඒ පාසැලේ අධ්‍යාපනය හදාරපු දරුවෙක් හැටියට එදා ඒ අවස්ථාව අපිට ලබලා දුන්නේ නෑ.

ඒ විතරක් නෙමෙයි ගරු සභාපතිතුමනි මා ළග ලැයිස්තුව තියෙනවා. ඕනේ නම් මේ ඩයරියේ තියෙනවා. විශ්‍රාමිකයෝ කීදෙනෙක් මේ ඩයරියේ ඇතුලේ නැවත සේවයේ යෙදිලා ඉන්නවද කියලා. තනතුරු මොන මොනවා හරි දාගෙන යාන වාහන දීගෙන ඒ බලපුළුවන්කාරකම් කරගෙන කටයුතු කරන අය ඉන්නවා කියන එක මම මේ අවස්ථාවේදී . අද මේ වෙන කොට ගරු සභාපතිතුමනි අපේ දැදිගම ආසනයේ මුදල් වෙන් කරලා සංවර්ධනය කටයුතු කරගෙන තියෙනවා. හැබැයි ප්‍රධාන ඇමති මහීපාල හේරත් මැතිතුමාගේ මූණ දාලා තියෙනවා. හොඳයි. දාන්නට ඕනේ අපේ ප්‍රධාන ඇමතිතුමාගේ. උපසභාපති ඔබතුමාගේ මූණ දාලා තියෙනවා. බොහොම හොඳයි මම සතුටු වෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි මම දැදිගම ආසනයේ නියෝජනය කරන පුරා අවුරුදු 19 ක් ඒ ආසනයේ දේශපාලනය කරන අද අපේ මූණ දාන්නේ නෑ. මේකද යහපාලනය කියන එක මම තමුන්නාන්සේගෙන් අහනවා ගරු සභාපතිතුමනි. යහපාලනය නම් ඒවාත් ඒ කටයුතු කෙරෙන්නට ඕනේ. එහෙම නම් මම දීර්සව කතා කරන්නේ නෑ. මම කරුණු රාශියක් ලියාගෙන ආවා. මේවා නම් වශයෙන් කියන්නට ගියොත් මට කියන්නට පුළුවන්. මෙවැනි දේවල් මේ පළාත් සභාව ඇතුලේ මින් ඉදිරියට නොවෙන්නට කෙරෙන්නට ඉඩ දෙන්නට එපා කියන යෝජනාව මතක් කරමින් සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ඒ කරුණුයි. හැකියාව අඩුකම නෙමෙයි. එක්කෙනාට දෙක තුන දුන්නහම ඉදිරියට එන්නට ඉන්න අයට අවස්ථාව නැහැ කියන මතක් කරමින්, එහෙම නම් ගරු සභාපතිතුමනි එතුමාගේ යෝජනාවට මමත් සහයෝගය දෙමින් මමත් සම්මත කරමින් නවතිනවා. ස්තුතියි.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක****கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக**Hon.D.ChairmanUdayakanthaGunathilaka*------------------------------------------------------------------------------------

බොහොම ස්තුතියි සිරිල් පල්ලේපොල ගරු මන්ත්‍රීතුමනි. මීළඟට අපේ සිරිපාල කිරිඇල්ල මැතිතුමාගේ යෝජනාව වෙනුවෙන් නිහාල් ෆාරුක් මැතිතුමා. එතුමා සභාවේ නෑ, එහෙම නම් එතුමාගේ යෝජනාව අදාල අංශ වලට ඒවගේම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට, ඒවගේම අගමැතිතුමාට , අතිගරු ජනාධිපතිතුමාට යැවීමට අවශ්‍ය කටයුතු කිරීමට ක්‍රියාත්මක කරනවා.

මීළගට අංක 15.2 යටතේ ගරු රංජිත් පොල්ගම්පොල මැතිතුමාගේ යෝජනාව. එතුමා සභාවේ නැහැ. ඊළඟට අංක 15.3 ගරු රම්‍යකුමාර වීරසිංහ මැතිතුමාගේ යෝජනාව. 6/1/2017/06

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*** *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි මගේ ඒ යෝජනා දෙක අද දවසේ යෝජනා වැඩි නිසා ඒ යෝජනා දෙකම ලබන සභා වාරයට ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක****கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக**Hon.D.ChairmanUdayakanthaGunathilaka*------------------------------------------------------------------------------------

එහෙම නම් එතුමාගේ ඒ යෝජනා දෙක ඊළඟ සභා වාරයට ඇතුල් කරන්න කටයුතු කරනවා.

මීළඟට 15.5 විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාගේ යෝජනාවට අවස්ථාව.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*** *கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல**Hon.Opposition Whip SiripalaKiriella* -----------------------------------------------------

ගරු සභාපතිතුමනි

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*** *கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.MemberK.L.Ratnayake* ------------------------------------------------

මේ සභාව බරපතල කාරණාවකට මුහුණ දීලා තියෙනවා. සණපූර්ණය නෑ. ප්‍රධාන ඇමතිතුමා විදේශගත වෙලා මහ ඇමතිවරයෙකුත් නෑ. මොකක්ද මේ උත්තරීතර සභාව ඇයි මේ විදිහට කරගෙන යන්නේ. මම කිව්වේ මේ සභාව අපෙන් පස්සේ උදවියටවත් වැරදි පූර්වාදර්ශ නැතිව තියන්න ඕනේ. තේරුමක් නෑ මේක.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක****கௌரவ பி.தவிசாளர் உதயகாந்த*

*குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*-------------------------------------------------------------------------------------

ඒක ඇත්ත. ගරු මන්ත්‍රීතුමා සණපූර්ණය නැත්නම් දැනුම් දෙන ක්‍රමවේදයක් තියෙනවා. ඒ ක්‍රමවේදය අනුව දැනුම් දුන්නේ නැති නිසා මට සභාව කල් තියන්න පුළුවන්කමක් නෑ. ඒකයි මම සභාව කල් තිබ්බේ නැත්තේ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල** கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்லHon.Opposition Whip SiripalaKiriella* ---------------------------------------------------

ගරු සභාපතිතුමනි අද දිනට මගේ තියෙන යෝජනාව ඊළඟ සභාවේ ඉදිරියෙන් තියෙන ලෙස කාරුණිකව ඉල්ලන අතර, මේ සණපූර්ණය නෑ කියන එක ඒ තරම් දෙයක් නෙමෙයි. අද පඩි දවස නම් මේක පිරිලා ඉන්නවා. පඩි දවස 28 වෙනිදාට තියෙන නිසා අද සණපූර්ණය අඩුයි ගරු සභාපතිතුමනි. ඒකයි තත්ත්වය.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ** கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க Hon.MemberRamya Kumara Weerasinghe* -------------------------------------------------------

හරි අපූරු කතාව. පඩි දවසට එන්න එහෙම 70,80 වෙනකන් ඉන්න ඕනේ කියලානේ කියන්නේ.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක** கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*-------------------------------------------------------------------------------------

මේක කරගන්න බැරි කාරණාව නෙමෙයි. සභාව සණපූර්ණය නෑ නිසා කල් තියන්න ගේන යෝජනාව ගේන ක්‍රමවේදයක් තියෙනවා. ඒ ක්‍රමවේදයට යෝජනාව ගෙනාවොත් මට පුළුවන් සභාව කල් තියන්න. එහෙම නැත්නම් මට එහෙම සභාව කල් තියන්න බෑ.

**සභාව කල් තැබීමේ යෝජනාව:**

***ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටිය** கௌரவ அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடியHon.Gov.WhipHarshaSiyambalapitiya*-------------------------------------------------------

ගරු සභාපතිතුමනි මෙම ගරු සභාව 2017 මාර්තු මස 28 වෙනි දින පෙරවරු 10.00 තෙක් කල් තබන්න යෝජනා කරනවා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක** கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka*-------------------------------------------------------------------------------------

බොහොම ස්තුතියි ගරු ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා. මීළඟට

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා:**

*ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල* *கௌரவ சிரில் பல்லேபொல* *Hon.Member Cyril Pallepola*
---------------------------------------------

ගරු සභාපතිතුමනි මා හිතවත් අතුල කුමාර රාහුබද්ද මැතිතුමට යොමු කරන ප්‍රශ්නයක් ගරු සභාපතිතුමනි. විශේෂයෙන් ගරු සභාපතිතුමනි ගලපිටමඩ දුනුමාල අලවල මාර්ගය කාපට් කරලා තියෙනවා ලොකු මුදලකින්. මම ඊයේ පෙරේදා ගියා ඒ පාරේ අත්තනගල්ලට යන පාර ගරු සභාපතිතුමනි ඒ පාරේ දෙපැත්තේ එජ් එක පුරවලා නෑ. අර ලොකු මුදලක් ලක්ෂ ගාණක් වියදම් කරපු එකේ දෙපැත්තේ එජ් එක කැඩිලා අද කාපට් එක කැඩි කැඩී යනවා. ඒ විතරක් නෙමෙයි ගරු සභාපතිතුමනි ගරු අමාත්‍යතුමනි ඔබතුමාත් දන්නවා අල්පිටිය හන්දියේ සිට කිවුල්දෙනිය කොටියාකුඹුර මාර්ගය කිවුල්දෙනිය විද්‍යාලයේ දරුවෙක් අද පාලම පල්ලට වැටුණා ආරක්ෂක වැට නෑ. තවත් කීප දෙනෙක් නැත්නම් වාහන කීපයක් හැප්පෙන්නට ඉඩ තියෙනවා. ඒ නිසා විශේෂ අවධානයක් යොමු කරලා විධායක ඉංජිනේරු කැගල්ල විධායක ඉංජිනේරු දැනුවත් කරලා ඒ වැට ආවරණය කර දෙන්න කටයුතු කරලා දෙන්න කියලා යෝජනා කරනවා.

මම ඉස්සෙල්ලා කියපු යෝජනාව තියෙන්නේ දෙහිඕවිට විධායක ඉංජිනේරු කාර්යාලයේ. මොකද දැන් ධාරානිපාත වැස්ස නිසා ඉක්මනින් ඒ පස් හේදි හේදි යනවා. මොකද අපේ පරාක්‍රම මන්ත්‍රීතුමාත් දන්න කාරණයක් මම මේ කිව්වේ. රුවන්වැල්ල ආසනයේ. නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා දන්න කාරණයක්. ඒ විතරක් නෙමෙයි ඒ මාර්ගය

ගලපිටමඩ,දුනුමාල,අලවල අත්තනගල්ල පන්සල ළඟට දෙපැත්තේ එහා පැත්ත බස්නාහිර පළාත් සභාව අපි දෙගොල්ලෝ සාකච්ඡා කරලා කතා කරලා ප්‍රධාන ඇමතිතුමන්ලා එක්ක කතා කරලා ඒ පාර මංතීරු දෙකට පළල් කරනවා නම් කරන්න සුදුසුයි කියන යෝජනාව මතක් කරනවා. ප්‍රධාන වශයෙන් මම අතුල ඇමතිතුමාට මතක් කරනවා මේ ගැන විශේෂ අවධානය යොමු කරලා කටයුතු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ස්තූතියි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka*------
--------------------------------------------------------------------------------

බොහොමත් ස්තූතියි සිරිල් පල්ලේපොල ගරු මන්ත්‍රීතුමනි. මීළඟට නිහාල් ෆාරුක් ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්* *கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்* *Hon.MemberNihalFarook*---------------------
-----------------------

ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ අපේ මාර්ග ඇමතිතුමාගේ අවධානය සඳහා. රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාශයේ දෙහිඕවිට විධායක ඉංජිනේරු බලප්‍රදේශයේ අම්තිරිගල එක්ස්සැල්ල මාර්ගය අපේ පරාක්‍රම අතාවුද මන්ත්‍රීතුමාත් දන්නවා. අපි ඊයේ සම්බන්ධීකරණ කමිටුවේදී කතා වුණා. මීටර් 800 ක් පමණ ඒ පාර දැඩි ලෙස අබලන් තත්ත්වයේ තිබෙන නිසා බස්නාහිර පළාතයි සබරගමුවයි සම්බන්ධ වෙන ස්ථානය සබරගමුව කොටස තමයි දැඩි ලෙස අබලන් වෙලා තිබෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි

ගරු අමාත්‍යතුමනි මේ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා මීටර් 800 ක්

පමණ තමයි තිබෙන්නේ. කලින් මේ පාර හැදුවා හැදුවාට සම්පූර්ණයෙන් ඒක නැවත මාස ගාණක් යන්නට කලින් සම්පූර්ණයෙන් විනාශ වෙලා ගියා. ලොකු මහජන මුදලක් මේකට වියදම් කරලා මේ විදිහට මහජන මුදල් නාස්ති කිරීම මං හිතන්නේ මහජන නියෝජිතයින් විදිහට අපිට ලොකු ගැටළුවක්. මහජනතාවටත් ගැටවවක්. පළාත් සභාවටත් අප්‍රසාදයක් මේ පිළිබඳව ඇති වෙලා තියෙනවා. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා අමිතිරිගල ඇස්සැල්ල මාර්ගය කඩිනමින් මේ පිළිබඳව ඇස්තමේන්තුවකුත් සකස් කරලා තියෙනවා විධායක ඉංජිනේරු කාර්යාලය හරහා. කඩිනමින් මේ මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස ඉතාමත්ම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka*--------------------------------------------------------------------------------------

ගරු අතුල කුමාර මන්ත්‍රීතුමාට මේ සම්බන්ධව අවස්ථාව.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*** *கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister Athula Kumara Rahubadda* ---------------------------------------------------

ගරු සභාපතිතුමනි මං හිතන්නේ මේ ප්‍රශ්නය උද්සෝෂණ ඒවගේම විවිධ ක්‍රියාමාර්ගවලට ගිය ප්‍රශ්නයක්. නමුත් මේ උද්සෝෂණයට විතරක් නෙමෙයි සියළු දෙනාගේම ඉල්ලීමට ප්‍රතිපාදන යවලා තිබුණා නමුත් අවාසනාවකට ඒ ඉදිකිරීම එතුමා කිව්වා වගේ මාස අටක් විතර යන කොට දැන් අපි දන්න විදිහට කරුණු නීත්‍යානුකූලව හොයලා බැලුවේ නෑ. දැනුම්දීම මත යම් කොන්ත්‍රාත්කාර මහත්මයෙක්ගේ අඩුපාඩු යටතේ මාස අටක් පමණ මේක විනාශයට පත් වෙලා කියන කාරණය දැන ගන්න ලැබුණා. ඒ අනුව අමාත්‍යාංශය මගින් වාර්තාවක් ගේනවා. වසරක වගේ කාලයක් අපිට තියෙනවා. ඒවගේම මේක එතුමා කියන්නේ මීටර් 800 ක් වගේ කියලා. 1.5 කට ආසන්නව තියෙනවා සමස්ත පාර බස්නාහිරට අවසානයේ කාපට් මාර්ගයක්. ඉතුරු වෙලා තියෙන කොටස විතරයි කාපට් නොවී තියෙන්නේ. අපේ අතාවුද මන්ත්‍රීතුමා ඒවගේම අජිත් ශාමින්ද මන්ත්‍රීතුමාලා මේ කොටස කාපට් කරලා දෙන්න කියන තාවකාලිකව අපි ගාව තියෙන ගල් තාර දාලා දෙන්න කියන ඉල්ලීම තමයි කලේ. ඒ අනුව අපි ඉදිරි කාලයේදී ඇස්තමේන්තුව කැඳවලා තියෙනවා. කාපට් සඳහා. ඒක ප්‍රතිපාදන තමුන්නාන්සේලාට ඉතාම ගෞරවයෙන් කියන්නේ ආණ්ඩුවට කියලා අවශ්‍ය කරන ප්‍රතිපාදන ටික ලබලා දෙනවා නම් වැඩ සටහන ඉතාම කාර්යක්ෂමව කරගෙන යනවා . ඒ විතරක් නෙමෙයි අර කාරණාවේදී ඔබතුමා ඉදිරිපත් කරපු පරීක්ෂණයකටත් අපි ලක් කරනවා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.ChairmanUdayakanthaGunathilaka*--------------------------------------------------------------------------------------

බොහොම ස්තූතියි ගරු අමාත්‍යතුමනි. මීළඟට විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக Hon.MemberK.L.Ratnayake
--------------------------------------------------

ගරු සභාපතිතුමනි දැන් ඔබතුමාට මේ කාරණය ඉස්සෙල්ලා කිව්වා. මේකේ සංපූර්ණය නෑ. මේක මොන්ටිසෝරියක් කරන්න එපා. සභාව කල් තියන්න යෝජනා කරනවා. මොකක්ද ඇමතිතුමන්ලා දෙන්නෙක් ඉන්නවා. මට පෙන්වන්න මහ ඇමතිතුමා කවුද කියලා මෙතන. අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමාටද නැත්නම් අපේ භාණු මුණිප්‍රිය ඇමතිතුමාද. වැඩ බලන මහ ඇමතිවරයෙක්වත් මෙතන නෑ. විදේශගත වෙලා. මේ සභාව කල් තියන්න. මොන්ටිසෝරියක් කරන්න එපා මේක.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka------
--------------------------------------------------------------------------------

සභාව කල් තියන කාරණාව නෙමෙයි. තමුන්නාන්සේලාගේ විපක්ෂ සංවිධායකවරයාගේ යෝජනාව තියෙන නිසා තමයි මම කල් තිබ්බේ නැත්තේ.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக Hon.MemberK.L.Ratnayake
--------------------------------------------------

ගරු සභාපතිතුමා අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමා වෙන්න පුළුවන්. භාණු ඇමතිතුමා වෙන්නට ඇති. මේ සභාවේ කවුරු හරි වෙන්නට පුළුවන්. සංපූර්ණය නැත්නම් සභාවක් අරගෙන යන්නේ කොහොමද කියලා මම අහන්නේ.එතකොට මේ සභාව අපි ඔක්කෝම මැරිලා යයි. මේකට එන අනාගත භාර ගන්න ඉන්න මන්ත්‍රීවරු ඇමතිවරුන්ට වැරදි පූර්වාදර්ශයක් දෙන්නට එපා. හරියට කරගෙන යන්න ගරු සභාපතිතුමා. ඔබතුමාත් එක්ක නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ. මෙතන ඉන්න ඇමතිවරුත් මන්ත්‍රීවරුත් එක්ක නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ. සංපූර්ණයක් තියෙන්න ඕනේ. සංපූර්ණයක් නැතුව සභාවක් කරගෙන යන්නේ කොහොමද. අඩුම ගානේ සංපූර්ණයක්වත් නෑ මේ සභාව කරගෙන යන්නට. අපහසුතාවයට පත් කරන්න එපා මේ සභාව.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.ChairmanUdayakanthaGunathilaka------
--------------------------------------------------------------------------------

මේ ගරු සභාව 2017 මාර්තු මස 28 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තියනවා.

අත්/කළේ :
උදයකාන්ත ගුණතිලක
උපසභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ක් වූ මාර්තු මස 20 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.